www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# නොනවතින විප්ලවය වටහාගැනීමෙහිලා අර්ථභාරී ප්‍රතිපදානයක්


## A significant contribution to an understanding of Permanent Revolution

**රිචඩ් බී. ඩේ හා ඩැනියෙල් ගයිඩෝ විසින් සංස්කරනය කර පරිවර්තනය කරන ලද (බ්‍රිල්, 2009) *Witnesses to Permanent Revolution: The Documentary Record*** (නොනවතින විප්ලවයේ සාක්ෂිකරුවෝ: ලේඛනගත වාර්තාව)

**ඩේවිඩ් නෝර්ත් විසිනි**

**2010 අප්‍රේල් 19**

***Witnesses to Permanent Revolution: The Documentary Record*** (නොනවතින විප්ලවයේ සාක්ෂිකරුවෝ : ලේඛනගත වාර්තාව) ප්‍රකාශයට පත්කිරීම, 1917 ඔක්තෝබර් විප්ලවයේ න්‍යායික පදනම් අධ්‍යයනයෙහිලා වැදගත් අවස්ථාවක් සනිටුහන් කරයි. රිචඩ් බී. ඩේ හා ඩැනියෙල් ගයිඩෝ යන ඉතිහාසඥයන් විසින් සංග්‍රහ කොට, පරිවර්තනය කර ඉදිරිපත්කල පිටු 677 න් සමන්විත මෙම වෙලුම තුල ඇති ලේඛන, නොනවතින විප්ලවයේ න්‍යාය පැනනැගීමට තුඩුදුන් මතභේද හා වාද විවාද පිලිබඳ සවිස්තර විමසුමක් සම්පාදනය කරයි. විසිවන සියවසේ මාක්ස්වාදී න්‍යාය හා විප්ලවවාදී මූලෝපායේ වර්ධනය වටහාගැනීමට උත්සුක වන්නන් සඳහා නැතුවම බැරි කෘතියක් ඩේ හා ගයිඩෝ විසින් නිර්මානය කර තිබේ.




ටොරොන්ටෝහි මිසිසවුගා විශ්ව විද්‍යාලයේ වසර ගනනාවක් උගැන්වීමෙහි නිරතව සිටින රිචඩ් ඩේ, සෝවියට් ඉතිහාසය, අර්ථශාස්ත්‍රය හා දේශපාලනය පිලිබඳව විශේෂඥයෙක් ලෙස නමක් දිනා සිටියි. 1973 වසරේ පලකරන ලද *Leon Trotsky and the Politics of Economic Isolation* (ලියොන් ට්‍රොට්ස්කි හා ආර්ථික හුදෙකලාවේ දේශපාලනය) ඔහුගේ වඩාත් ප්‍රකට කෘතියයි. එය, 1920 ගනන් වල සෝවියට් සංගමයේ ආර්ථික පිලිවෙත අරභයා ඇතිවූ අරගලය යටින් පැවති තීරනාත්මක න්‍යායික ප්‍රශ්න පිලිබඳ වැදගත් නිරාවරනයකි. මේවාට, 1985 වසරේදී ඩේ විසින් පරිවර්තනය කරන ලද ස්ටැලින් විසින් 1937 වසරේදී මරාදමන ලද ට්‍රොට්ස්කිවාදී වාම විපාර්ශවයේ වැදගත් පුද්ගලයෙක්වූ ඊ. ඒ. ප්‍රියෝබ්‍රෙෂන්ස්කිගේ *Decline of Capitalism* (ධනවාදයේ පරිහානිය) නමැති කෘතිය ද ඇතුලත් වන අතර නොතකාහැර තිබුනු ඔහුගේ ජීවිතය හා අදහස් ඩේ ඓතිහාසික අන්ධකාරයෙන් මුදා එලිමහනට ගෙන ආවේය. මාක්ස්වාදී දර්ශනවාදය ද ඇතුලු පුලුල් පරාසයක මාතෘකා අලලා මහාචාර්ය ඩේ ලිපි ලේඛන සම්පාදනය කර තිබේ. ඔහු දැනට, මෙතෙක් දැන නොසිටි ප්‍රියෝබ්‍රෙෂන්ස්කිගේ ලිපි ලේඛනවල නව වෙලුමක් ප්‍රකාශනය සඳහා සූදානම් කරමින් සිටියි.

ආර්ජන්ටිනාවේ උපන් ඩැනියෙල් ගයිඩෝ දශකයකට වැඩි කාලයක් ඊස්රායලයේ ජීවත් වෙමින් අධ්‍යයන කටයුතුවල නිරත විය. ඔහු පලස්තීනුවන්ගේ ප්‍රජාතන්ත්‍රීය අයිතීන් ආරක්ෂා කිරීමේ අරගලයට ක්‍රියාශීලීව සම්බන්ධ විය. මෑතකදී යලි ආර්ජන්ටිනාවට පැමිනි ගයිඩෝ ගේ ප්‍රකාශිත කෘතීන් අතර 2006 දී පලකල *The Formative Period of American Capitalism: A Materialist Explanation* (ඇමරිකානු ධනවාදය ගොඩනැගුනු අවධිය: භෞතිකවාදී විමර්ශනයක්) නමැති ග්‍රන්ථය ද වෙයි. දැන් අපගේ විමර්ශනයට ලක්ව තිබෙන මෙම කෘතිය පෙන්නුම් කරන ආකාරයට, ඇමරිකානු ඉතිහාසය ඔහුගේ පර්යේෂනයට හසුවන එකම ක්ෂේත්‍රය නොවේ. ගයිඩෝ ජර්මානු සමාජවාදී ව්‍යාපාරය පිලිබඳව ද පුලුල්ව ලියා ඇත. දැනට ඔහු, දෙවන ජාත්‍යන්තරය පැවති අවධියේ ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ ඉතිහාසය ලියමින් සිටියි.

*Witnesses to Permanent Revolution* (නොනවතින විප්ලවයේ සාක්ෂිකරුවෝ) කෘතියේ මූලික අරමුන වන්නේ, නොනවතින විප්ලවයේ න්‍යාය පැන නැංවූ සාකච්ඡා මාලාවේ සිත්කාවදින බුද්ධිමය විෂය පථය ප්‍රතිනිර්මානය කිරීමයි. එම න්‍යාය විස්තාරනය කිරීමේ දී හා, විශේෂයෙන්ම රුසියානු කම්කරු පන්තියේ අරගල තුල එහි මූලෝපායික හා

ප්‍රායෝගික භාවිතයේදී ට්‍රොට්ස්කි ඉටුකල තීරනාත්මක භූමිකාව විවාදයට ලක් නොකරම ඩේ හා ගයිඩෝ, ෆ්‍රාන්ස් මේරිංග්, රෝසා ලක්සම්බර්ග්, ඇලෙක්සැන්ඩර් හෙල්ෆන්ඩ් (පාවුස්) කාල් කවුට්ස්කි හා වඩා ප්‍රකට නොවන ඩේවිඩ් රියාසනොව් වැනි අනෙකුත් වැදගත් සමාජවාදී චින්තකයන් විසින් කරනු ලැබූ ප්‍රතිපදානයන් පාඨකයා හමුවට පත්කිරීමට උත්සාහ දරයි. තමා එතරම්ම තීව්‍ර ලෙසත්, පෞද්ගලිකවත් අනන්‍යව ඇති න්‍යායේ මූලාරම්භයන් පිලිබඳ මෙම සවිස්තරාත්මක විවරනයට, ට්‍රොට්ස්කි පවා විරුද්ධ නොවනු ඇත.

දේශපාලන කමිටුව තුල තුන් හවුලක් ලෙස ක්‍රියා කරමින් සිටි සිනෝවියෙව්, කමනෙව් හා ස්ටැලින් ට්‍රොට්ස්කිට එරෙහිව 1923 දී දියත් කල කන්ඩායම්ක ප්‍රහාර, නොනවතින විප්ලවයට එරෙහි ව්‍යාපාරයක් ලෙස ඉක්මනින්ම වැඩී ගියේය. ට්‍රොට්ස්කිට එරෙහිව එල්ල කෙරුනු පෞද්ගලික සාර්ථකත්වය හා දේශපාලන වැරදි පිලිබඳ සාවද්‍ය චෝදනා අතර මුල්තැන ගත් "ගොවි ජනතාව අවතක්සේරු කිරීම" හා "ප්‍රතිබෝල්ශෙවික්වාදය" නොනවතින විප්ලවය නම් විසකුරු න්‍යාය තුල මුල්බැස පැවැත්තේ යයි අතොරක් නැතිව නිවේදනය කරන ලදී. 1917 අප්‍රේල් හා ඔක්තෝබර් අතර කාලය තුල ධනේශ්වර තාවකාලික ආන්ඩුවට හා එහි මෙන්ෂෙවික් හවුල්කරුවන්ට එරෙහි බොල්ශෙවික් පක්ෂ අරගලයේ මූලෝපායික පදනම සම්පාදනය කලේ නොනවතින විප්ලවයේ න්‍යාය යි. එහෙත් යන්තම් සය වසරකට පසුව එය, මාක්ස්වාදී මූලධර්මවලින් මිත්‍යාදෘෂ්ටික ලෙස අපසරනය වීමක් යයි හෙලාදකින ලදී. ට්‍රොට්ස්කිට අත්දකින්නට ලැබුනේ තමන්ගේ අදහස් විකෘත කිරීමක් පමනක් නොව සමාජවාදී න්‍යාය පිලිබඳ ඉතිහාසයම මුසාකරනයට ලක් කිරීමයි. ට්‍රොට්ස්කි දැඩි කෝපය පලකරමින් මේ පිලිබඳව ලිවීය.

> "*නොනවතින විප්ලවය*" යන වචනය මාක්ස්ගේම යෙදුමකි. ඔහු එය 1848 විප්ලවයට යෙදීය. මාක්ස්වාදයේදී, - ස්වභාවිකව ම සංශෝධනවාදයේ නොව මාක්ස්වාදී සාහිත්‍යයේදී - මෙම යෙදුම සැම විටම නිවැරදි යයි සැලකිල්ලට ලක්ව තිබුනි. ෆ්‍රාන්ස් මේරිංග් එය 1905-07 විප්ලවය සඳහා භාවිතා කලේය. කෙලින්ම පරිවර්තනය කලහොත් නොනවතින විප්ලවය යනුවෙන් අදහස් කරන්නේ අඛන්ඩ විප්ලවයයි, නිර්බාධිත විප්ලවයයි. (1)

නොනවතින විප්ලවයේ න්‍යාය පිලිබඳ මාක්ස්වාදී අධිකාරිය මත ට්‍රොට්ස්කි යොදන අවධාරනය, ඩේ හා ගයිඩෝ ද සනාථ කරයි. ඔවුන් සඳහන් කරන පරිදි, 1843 තරම් මුලදී ම මාක්ස්, *The Jewish Question* (යුදෙව් ප්‍රශ්නය) පිලිබඳ සිය ලේඛනය තුල මෙසේ ලියා තැබීය. "රාජ්‍යයට ආගම අහෝසි කිරීමේ කර්තව්‍යය සාක්ෂාත් කරගත හැක්කේ එහිම (රාජ්‍යයේම) පැවැත්මේ කොන්දේසි සමග බිහිසුනු ගැටුමකට එලඹීමෙන් පමනි, විප්ලවය නොනවතින බව ප්‍රකාශයට පත්කිරීමෙන් පමනි." (2) 1850 මාර්තුවේදී සිය "ලීගයේ (කොමියුනිස්ට් ලීගයේ) මධ්‍යම අධිකාරියට ඇමතීම" තුල මාක්ස් හා එංගල්ස් මෙසේ ලිවූහ. ප්‍රජාතන්ත්‍රවාදී සුලු ධනේශ්වරයට එරෙහිව කම්කරුවන්ගේ කර්තව්‍යය වන්නේ,

> අඩු වැඩි වශයෙන් සෑම අධිපති පන්තියක්ම ඔවුන්ගේ පාලක තත්වයන්ගෙන් පලවාහරින තෙක්ම, නිර්ධනීන් රාජ්‍ය බලය අල්ලා ගන්නා තෙක්ම හා එක් රටක් තුල පමනක් නොව ලෝකයේ සෑම ප්‍රධාන රටක් තුලම සැලකිය යුතු ප්‍රගතියක් අත්කරගන්නා තෙක්ම, මෙම රටවල කම්කරුවන් අතර තරගය අවසන් වන තෙක් හා අඩුම තරමින් නිෂ්පාදනයේ තීරනාත්මක බලවේගයන් කම්කරුවන් අත සංකේන්ද්‍රනය වන තෙක්ම, විප්ලවය නොනවත්වා ගෙනයාමයි. *අපගේ උත්සුකය හුදෙක් පෞද්ගලික දේපල නවීකරනය නොව එය අහෝසි කිරීමයි, පන්ති ප්‍රතිවිරෝධයන් නිහඬ කිරීම නොව පන්ති ම අහෝසි කිරීමයි, පවත්නා සමාජය වැඩි දියුනු කිරීම නොව නව සමාජයක් නිර්මානය කිරීම යි. (3)*

විප්ලවයේ නොනවතින ස්වභාවය පිලිබඳ සංකල්පය වැඩී ආවේ 1848 වසරේ යුරෝපය සිසාරා ගිය පන්ති අරගලයන්ගේ අත්දැකීම් තුලිනි. ප්‍රජාතන්ත්‍රවාදයේ අතිශයින්ම පෙරලිකාරී කොටස නියෝජනය කල ජැකොබින්වරුන් විසින් විප්ලවවාදී ත්‍රස්තයේද ආධාරය ලබමින් වැඩවසම් පැරනි තන්ත්‍රය (*ancient regime*) බිඳදමනු ලැබීමේ පටන් ගෙවී ගිය අඩ සියවසකට මඳක් වැඩි කාලයක් තුල ප්‍රන්සයේ ධනේශ්වර රාජ්‍යයක් පිහිටුවීම සඳහා අඩිතාලම දමනු ලැබිනි. අතරතුර කාලයේදී යුරෝපයේ සමාජ අඩිතාලම වඩාත් සංකීර්න තත්වයකට පත්විය. දේපල නොමැති පන්තියක් වූ කම්කරු පන්තිය නව සමාජ බලවේගයක් ලෙස මතුවී ඒම මගින් ධනේශ්වරය හා පැරනි වංශාධිපති පැලැන්තිය අතර සිදුවෙමින් පැවති දේශපාලන ගැටුමේ ස්වභාවය හා එහි දේශපාලන ඇඟවුම් වෙනස්කරනු ලැබිනි. නව කම්කරු පන්තික ජනසමූහයන් පැරනි වංශාධිපතිත්වයට එරෙහි මහජන නැගිටීම් තුලට ඇදගනු ලැබීමෙන් වැඩවසම් වරප්‍රසාදයන්ගේ ශේෂයන්ට පමනක් නොව ධනේශ්වර දේපලවලටම තර්ජනය කරන පරිමානයක් අත්කරගනු ඇතැයි ධනේශ්වරය බිය පත්වූහ.

මේ නිසා 1848 වසරේ හා ඉන් ක්ෂනික ඉක්බිත්තෙහි හටගත් අරගලයන්හි දී ධනේශ්වරය, කම්කරු පන්තියේ වියදමෙන් විප්ලවවාදී අරගලය

අත්අඩංගුවට ගැනීමට උත්සාහ කලහ. විප්ලවයේ හා දේශපාලනිකව වැඩි දියුනු යුරෝපීය රාජ්‍යයන්ගේ පැරනි මධ්‍යස්ථානය වූ ප්‍රන්සයේ දී, ජෙනරාල් කවේනියාගේ මෙහෙයවීම යටතේ මිලිටරි සේනාංකයන් 1848 ජූනි මාසයේදී පැරිස් කම්කරුවන් ඝාතනය කිරීම තුල, නව පන්ති සම්බන්ධතා සිය කුරිරු ප්‍රකාශනය අත්කර ගත්තේය. ධනේශ්වරය, ප්‍රන්ස දේශසීමාවන්ගෙන් ඔබ්බෙහි ප්‍රජාතන්ත්‍රවාදී සමූහාන්ඩුවක් පිහිටුවීමේ ඉල්ලීම අතහැර දමා රාජ්‍යයේ වංශාධිපති අධිකාරය පවත්වාගෙන යාම පිලිගන්නා තරම් දුරට පවා, පැරනි තන්ත්‍රයන් සමඟ සම්මුතියකට යාමට කැමැත්තක් දැක්වූහ. ජනතා කැරලිකාරිත්වයෙන් හා "කොමියුනිස්ට්වාදයේ අවතාරයෙන්" භීතියට පත් ධනේශ්වරය, පෘසියානු වංශාධිපතිත්වයට දේශපාලනිකව යටත්වීම, ජර්මානු විප්ලවයේ ඉරනම බවට පත්විය.



මාක්ස්

කම්කරු පන්තියේ මිතුරා ලෙස කිසිසේත්ම විශ්වාස නොකලහැකි බව සෑම තීරනාත්මක අදියරකදී තෙමේම සනිටුහන් කර ගත්තාවූ "වාම" සුලු ධනේශ්වරයේ නියෝජිතයන් විසින් "තමන්ගේම" ධනේශ්වර විප්ලවය පාවාදුන් ධනේශ්වරයට, පාවඩ එලන ලදී. "මධ්‍යම අධිකාරියට ඇමතීම" තුල මාක්ස් හා එංගල්ස් මෙසේ පැහැදිලි කලහ.

> විප්ලවකාරී කම්කරුවන් සඳහා සමස්ත සමාජය පරිවර්තනය කිරීම කෙසේ වෙතත්, ප්‍රජාතන්ත්‍රවාදී සුලු ධනේශ්වරය ඇලුම්කරන්නේ හා වෙර දරන්නේ, පවත්නා සමාජය හැකිතාක් දුරට තමන්ගේ සුව පහසුව සැලසෙන හා තමන්ට ගැලපෙන තැනක් බවට පත්කර ගැනීම සඳහා එහි සමාජ කොන්දේසි වෙනස් කිරීමට ය. (4)

මාක්ස් හා එංගල්ස් මෙසේ සමාප්ත කලහ. කම්කරු පන්තිය තම අරගල හා ආසක්තයන් සීමාකිරීමට හා පාවාදීමට ඉඩ නොදිය යුතුය. ඒ වෙනුවට කම්කරුවන්,

> තමන්ගේ පන්තිය සිය අවශ්‍යතා කවරේදැයි තමන්ටම පැහැදිලි කරගැනීම මඟින්, සිය අවසන් ජයග්‍රහනය වෙනුවෙන් කලහැකි සියල්ල කල යුතුය. කම්කරුවන්ගේ පක්ෂය ස්වාධීනව සංවිධානය කරගැනීමෙන් තමන් වලක්වාලන, ප්‍රජාතන්ත්‍රවාදී සුලු ධනේශ්වරයේ කුහක වදන් මගින් තමන් මුලාවේ හෙලීමට එක මොහොතකට හෝ ඉඩ නොතබමින්, හැකිතාක් ඉක්මනින් ස්වාධීන පක්ෂයක් ලෙස තමන් පිහිටුවාගත යුතුය. ඔවුන්ගේ සටන් පාඨය විය යුත්තේ, නොනවතින විප්ලවයයි. (5)

පනස් වසරකට පසුව විසිවන සියවසට එලඹෙද්දී, මෙම සටන්පාඨයේ දේශපාලන වැදගත්කම හා ඇඟවුම් එවකට වේගයෙන් වැඩෙමින් තිබුනු රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය තුල තියුනු විවාදයක මාතෘකාව බවට පත්විය. වසර 300 පැරනි ආඥාදායක තන්ත්‍රය පසෙකට අතුගා දමන ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයක් කරා එරට නිර්දය ලෙස තල්ලුවෙමින් පැවතුනේය යන්න ගැන විවාදයක් නොවීය. එහෙත් එම පොදු ප්‍රතිඥාවට ඔබ්බෙන්, විප්ලවවාදී ව්‍යාපාරයේ පන්ති ගතිකය, දේශපාලන අරමුනු හා අවසාන වශයෙන් එහි සමාජ ආර්ථික ප්‍රතිවිපාක පිලිබඳව තියුනු ලෙස බෙදීගිය අදහස් වැඩෙමින් තිබුනි. රුසියානු විප්ලවය, අවසානයේදී ධනේශ්වර ආර්ථික සම්බන්ධතා තුල මුල්බැසගත් ධනේශ්වර දේශපාලන බලය පිහිටුවීමට මග පෑදූ, 1789-1794 වසරවල වැඩවසම් ආඥාදායකත්වය පෙරලා දැමූ, "සම්භාව්‍ය" ප්‍රන්ස විප්ලවයේ මග ගනු ඇත් ද? නැතහොත්, සියවසකටත් වඩා පසුව මෙන්ම, බෙහෙවින් වෙනස්වූ සමාජ-ආර්ථික කොන්දේසි යටතේ වර්ධනයවූ රුසියානු ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය, අවශ්‍යයෙන්ම ප්‍රගාඪ ලෙස වෙනස්වූ මඟක් ගනු ඇත් ද? 1790 ප්‍රන්සයේ සිටි ආකාරයේ විප්ලවවාදී ධනේශ්වරයක් 1900 රුසියාව තුලත් සිටියේ ද? රුසියානු ධනේශ්වරය ආඥාදායකත්වයට එරෙහිව විප්ලවවාදී අරගලයක් ගෙනයාමට හෝ ඊට සහාය දැක්වීමට වුවත් සූදානම්ව සිටියෝ ද? අවසාන වශයෙන් රුසියාව, ආර්ථික වශයෙන් හා දේශපාලනිකව සමාජවාදය සඳහා සැලකිය යුතු තරම් පරිනත වන්නේ කවදාදැයි කිසිවෙකුත් හරියාකාරව දැන නොසිටියහ. එම තත්වයේදී කම්කරු පන්තිය, ධනේශ්වර තන්ත්‍රය පෙරලා දැමීම කරා පෙරට යා යුතු විය.



එංගල්ස්

රුසියාව 20 සියවසට එලඹෙන විට අන් සියල්ලටත් වඩා ප්‍රමුඛ ප්‍රශ්නය වූයේ එරට වඩාත්ම ක්‍රියාශීලී හා ගතික සමාජ බලවේගය කාර්මික කම්කරු පන්තිය වූයේය යන කාරනය, ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ වර්ධනය කෙරේ කෙසේ බලපානු ඇත් ද යන්නයි. මහා පරිමාන

කාර්මීකරනයේ ආයෝජන ලෙස විදේශ ප්‍රාග්ධනය රුසියාව තුලට ඇදී ඒමත් සමග, වේගයෙන් වර්ධනයවූ කම්කරු පන්තියේ ඉමහත් බලය, 1890 ගනන් වල වැඩවර්ජන රැල්ලෙන් ඒ වන විටත් පෙන්නුම් කර තිබුනි. කාර්මික කම්කරුවන් ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය තුල ඉටුකරනු ඇත්තේ කුමන භූමිකාවක් ද? ආඥාදායකත්වය පෙරලා දැමීමේදී කම්කරු පන්තියේ ශක්තිය තීරනාත්මකය යන්න ගැන කිසිදු සැකයක් නොවීය. එහෙත් කම්කරු පන්තිය එවිට, සිය පන්ති සතුරා වන රුසියානු ධනේශ්වරය වෙත බලය පැවරීමට එකඟවිය යුතු ද? නැතහොත්, ධනේශ්වර දේපල පිලිබඳ පාරිශුද්ධත්වය කෙලෙසන, සමාජයේ දුරදිග යන ආර්ථික ප්‍රතිව්‍යුහකරනයට මුලපුරමින්, බලය සියතට ගැනීමෙහි ලා "සම්ප්‍රදායික" ප්‍රජාතන්ත්‍ර විප්ලවයේ සීමාවන් ඉක්මවා ඉදිරියට යා යුත්තේ ද?



**කවුට්ස්කි**

මෙම ප්‍රශ්න මතුකිරීම නොවැලැක්විය හැකි ලෙසම තුඩු දුන්නේ, මාක්ස්-එංගල්ස්ගේ නොනවතින විප්ලවය පිලිබඳ සංකල්පය යලි සලකා බැලීමට හා තවදුරටත් විස්තාරනය කිරීමට ය. මෙම වෙලුම තුල සංගෘහිත ලිපිලේඛන, 1903 හා 1907 අතර කාලයේ රුසියානු හා ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ව්‍යාපාරය තුල දිග හැරුනු සාකච්ඡාවන්ගේ බුද්ධිමය ගැඹුර පිලිබඳව සාක්ෂි දරයි. ආඥාදායකත්වයේ ගැඹුරුවන දේශපාලන අර්බුදයක පසුබිම හමුවේ රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු පක්ෂය තුල, ආරම්භයේ පටන්ම එය මෙහෙයවූ දේශපාලන ඉදිරිදර්ශනය පිලිබඳව වැඩෙමින් තිබුනු අතෘප්තියක් ප්‍රකාශිත විය. ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය පිලිබඳව එක හෙලාම පිලිගන්නා ලද, එනම්, සාර් බලයෙන් පහකිරීම, නොවැලැක්විය හැකි හා අනිවාර්ය ලෙසින් දේශපාලන බලය රුසියානු ධනේශ්වරය අතට පත්කරන්නේය යන සංකල්පය කෙරෙහි, න්‍යායික හා දේශපාලන විරුද්ධත්වය මතුවී ආවේය.

එම ඉදිරිදර්ශනය ප්‍රධාන කොටම අනන්‍යවී තිබුනේ "රුසියානු මාක්ස්වාදයේ පියා" ලෙස සැලකූ ජී. වී. ප්ලෙකානොව් ගේ වැඩ කටයුතු සමග ය. ප්ලෙකානොව් කියා සිටියේ සාර්වාදයට එරෙහි අරගලය තුල කම්කරු පන්තිය, ලිබරල් ධනේශ්වරය සමග පෙලගැසිය යුතුය යන්නයි. ආඥාදායකත්වය පෙරලා දැමීමෙන් පසුව පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදයේ රුසියානු සංස්කරනයක් පිහිටුවිය යුතුය. කම්කරු පන්තියේ පක්ෂය, සමාජවාදී විරුද්ධ පක්ෂය ලෙස රුසියානු පාර්ලිමේන්තුවට ඇතුල්වී, ලිබරල් ප්‍රජාතන්ත්‍රවාදී තන්ත්‍රය හැකිතාක් දුරට වමට තල්ලු කිරීමට උත්සාහ කල යුතුය. එහෙත් රට අනාගතයේ අනියමිත කාලයකට ධනේශ්වර පදනමක සංවර්ධනය වනු ඇත. හරියටම කවදා දැයි කිසිවෙකුත් නොදන්නා අවසානයකදී රුසියාව, දේශපාලනිකව හා ආර්ථික වශයෙන් සමාජවාදය සඳහා සැලකිය යුතු තරමින් මෝරායනු ඇත. එම අවස්ථාවේදී කම්කරු පන්තිය ධනේශ්වර තන්ත්‍රය පෙරලා දැමීම කරා පෙරට යා යුතුය.

මෙම ඉදිරිදර්ශනයේ මූඛ්‍ය ගැටලුව වූයේ ඉතිහාසය විසින් ඒවන විටත් ඉක්මවා ගොස් තිබුනු සූත්‍රයකට අනුකූල වන පරිදි, ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ ස්වභාවය අර්ථ දැක්වීමට උත්සාහ ගෙන තිබීමයි. සත්තකින්ම, 1889 තරම් ඈතදී ම, ප්ලෙකානොව් අවධාරනය කර සිටියේ, රුසියාවේ ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය කම්කරුවන්ගේ විප්ලවයක් ලෙස පමනක් සාක්ෂාත් විය හැකි බවයි. එහෙත් ප්ලෙකානොව් එක දිගටම අවධාරනය කල පරිදි ආඥාදායකත්වය පෙරලා දැමීමේ තීරනාත්මක බලවේගය කම්කරු පන්තිය වන්නේ නම්, දේශපාලන බලය අවශ්‍යයෙන්ම ලිබරල් ධනේශ්වරය අතට පත්කල යුත්තේ මක්නිසා ද? එවන් ප්‍රශ්න යටපත් කිරීමට ගත් උත්සාහයේදී ප්ලෙකානොව්ට දිය හැකිව තිබූ එකම පිලිතුර වූයේ, කම්කරු පන්තියට දේශපාලන බලය අල්ලා ගනිමින් සමාජවාදී ආකාරයේ පිලිවෙත් ක්‍රියාත්මක කිරීමට ඉඩ සැලසෙන තරමට රුසියාවේ ආර්ථික වර්ධනය පරිනතවී නැතැයි යන්නය.

රුසියානු වර්ධනයන් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය පිලිබඳ සම්ප්‍රදායික ආකෘතිය තුල පෙර දුටු ආකාරයට වඩා මුලුමනින්ම වෙනස් මගක් ගනු ඇතැයි සංකල්පනය කල පලමු වැදගත් න්‍යායාචාර්යවරයා කාල් කවුට්ස්කි වීම කැපී පෙනෙයි. මෙම වෙලුම තුල ප්‍රති සම්පාදනය කර තිබෙන 1902-07 අතර කාලයේ කවුට්ස්කි විසින් ලියන ලද ලිපි මාලාවකින්, ප්ලෙකනොව්ගේ ධර්මවාදී ඉදිරිදර්ශනයට ගැඹුරින්ම වල කැපූ අතර, යල් පිනූ පූර්වාදර්ශයන් කෙරෙහි විවේචනාත්මක ආකල්පයක් වර්ධනය කිරීමට ඉවහල් විය. එමෙන්ම ලියොන් ට්‍රොට්ස්කි හා රෝසා ලක්සම්බර්ග් වැනි රුසියානු හා පෝලන්ත සමාජ ප්‍රජාතන්ත්‍රවාදී න්‍යායාචාර්යවරුන්ගේ තරුන පරම්පරාවකට මග හෙලිකල වැඩකටයුතු එමගින් දිරිමත් කලේය.

1902 ලියන ලද ,The Slavs and Revolution, "ස්ලාව් ජාතිකයන් හා විප්ලවය" නමැති ලිපියක් තුල කවුට්ස්කි, සාර්වාදයට එරෙහි අරගලයේදී රුසියානු

ධනේශ්වරය විප්ලවවාදී භූමිකාවක් ඉටුකරනු ඇතැයි යන සංකල්පය ප්‍රශ්නයට බඳුන් කලේය. පූර්ව ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයන්ගේ අවධියේ පටන් පන්ති සම්බන්ධතාවන්ගේ ගතිකය ප්‍රගාඪ ලෙස වෙනස්වී තිබේ. කවුට්ස්කි මෙසේ ලිවීය. "1870 පසුව සියලු රටවල ධනේශ්වරයන් ප්‍රජාතන්ත්‍රවාදී අභිලාෂයන් පිලිබඳ අවසන් ශේෂයන්ද අහිමිකර ගැනීමට පටන්ගත් අතර, ඉන් පසුව විප්ලවවාදියෙක් යන්නෙහි අර්ථය වන්නේ සමාජවාදියෙක් යන්නයි." (6)

1903 පලමුවරට ලියනලද හා 1906 සංස්කරනය කල "කොමියුනිස්ට් ප්‍රකාශනය යල්පැන ඇත්තේ කෙතෙක් දුරට ද?" යන අවුස්සන සුලු ශීර්ෂ පාඨයක් සහිත තවත් රචනාවක් තුල කවුට්ස්කි මෙසේ සඳහන් කරයි.

> ප්‍රකාශනයේ ''අඩුපාඩුවක්'' පිලිබඳව කථාකරන හා විවේචනය අවශ්‍ය යයි කියා සිටිනතාක් දුරට, අප පටන් ගත යුත්තේ හරියටම, දේශපාලන අර්ථයෙන් ධනේශ්වරය විප්ලවවාදීය යන 'අදානග්‍රාහය' සමගය. පසුගිය පනස් වසරක කාලය තුල පරිනාමය විසින් විප්ලවයම විස්ථාපනය වී ඇතැයි යන්න වැඩී ආවේ, විප්ලවවාදී ධනේශ්වරයක් තව දුරටත් නොපවතින්නේය යන කාරනයෙනි. (7)

පලමු ලෝක සංග්‍රාමයට පෙරාතුව, නොනවතින විප්ලවයේ ඉදිරිදර්ශනය වර්ධනය කිරීම තුල කවුට්ස්කි විසින් ඉටුකරන ලද දැවැන්ත භූමිකාවේ සැබෑ ඓතිහාසික වාර්තාවට අනුකූලව, ඩේ-ගයිඩෝ කරන ලද ප්‍රතිපදානය මෙම සංග්‍රහයෙහි වඩාත්ම වැදගත් ජයග්‍රහනයන් අතුරින් එකකි. රුසියානු විප්ලවය පිලිබඳ කවුට්ස්කිගේ ලිපිලේඛන ප්‍රකාශයට පත්කිරීමෙන්, "ශමනවාදයේ ධර්ම දූතයෙකු හා විප්ලවවාදී වාගාලාපයන්ගෙන් වෙලුනු සංශෝධනවාදියෙක් ලෙස කවුට්ස්කි පිලිබඳව ගොඩනැගී ඇති අවකැපෙන හා වැරදියට වටහාගැනීමේ දෘෂ්ටිය ජයගැනීමට" පිටිවහලක් වනු ඇතැයි තමන් බලාපොරොත්තු වන බව ඩේ හා ගයිඩෝ සඳහන් කරයි. (8) ඔවුහු මෙසේ ද පවසති.

> 1917 කවුට්ස්කිගේ පසුකාලීන ප්‍රති-බොල්ශෙවික්වාදී විවාද වලින් උපුටාගත් අති-සාමාන්‍යකරනයක් වන මෙම දෘෂ්ටිය, පලමුවෙන් ඉදිරිපත් කලේ අති-වාම දර්ශනවාදියෙකුවූ කාල් කොෂ් විසිනි. ඒ, කවුට්ස්කිගේ *Die materialistische Geschichtsauffassung* නමැති කෘතියට ඔහු 1927 දී ලිවූ පිලිතුර තුලය. *Kautsky and Kautskyanism* (කවුට්ස්කි හා කවුට්ස්කිවාදය) නමැති එරික් මැතියස්ගේ පොත පලකිරීමෙන් පසුව, කොෂ්ගේ දෘෂ්ටිය ශාස්ත්‍රාලික කවයන් තුල මුල්බැස ගත්තේය. කවුට්ස්කිගේ ප්‍රධාන චරිතාපදායකයාවූ මරෙක් වැල්ඩෙන්බර්ග්, ලෙනින් හෝ ට්‍රොට්ස්කි යන කවරෙකුගේවත් අනුමැතිය පල නොවූ මෙම ප්‍රවාදය නිෂ්ප්‍රභා කරන කරුනු රාශියක් සම්පාදනය කලේය. ඒ දෙදෙන හැමවිටම, කවුට්ස්කිගේ විප්ලවවාදී අවධියේ ලිපිලේඛන කොමියුනිස්ට් කම්කරුවන් සඳහා නිර්දේශ කලහ. (9)

ලෙනින් හා ට්‍රොට්ස්කි අවධාරනය කල පරිදි, පසුකාලීනව සිදුවූ කවුට්ස්කිගේ සමාජවාදය පාවාදීම වනාහි, තමන්ගේම කාර්ය සිද්ධිය ඔහු විසින් ප්‍රතික්ෂේප කිරීමක් විය. "කවුට්ස්කි වරෙක කෙතරම් හොඳින් ලිව්වේ ද යත්" යන වැකිය යොදාගැනීමේදී ලෙනින් ප්‍රකාශයට පත්කලේ, තමන්ගේ ගුරුවරයාව සිටි මේ මිනිසාගේ දේශපාලන හා බුද්ධිමය බිඳවැටීම පිලිබඳව ඔහු තුල ඇතිවූ ගැඹුරු විශ්මය හා කෝපයයි. 1914 අගෝස්තුවේදී කවුට්ස්කිගේ පාවාදීම, විප්ලවවාදීන්ගේ සමස්ත පරම්පරාවකටම එතරම් කම්පනයක් ඇතිකලේ මන්ද යන්න මෙම වෙලුම තුලින් පැහැදිලි කෙරෙයි. මෙම සංග්‍රහය තුල, කවුට්ස්කිගේ විප්ලවවාදී ලියවිලිවල සැබවින්ම අනර්ඝ ඡේද බොහොමයක් අඩංගුවන අතර, දෙවන ජාත්‍යන්තරයේ "මාක්ස්වාදී පාප් වරයා" සැලකියයුතු ප්‍රත්‍යක්ෂ ඥානයකින් යුතු, දුර දක්නා හා දැඩි අධිෂ්ඨානයකින් යුතු විවාදකරුවෙකු වූ බව හෙලිදරව් කරන උද්ධෘතයන් ද එහිදී අපට හමුවේ. මෙම අදහස අවධාරනය කිරීමේ ආශාව මැඩගැනීම දුෂ්කරය.

ප්‍රත්‍යාවලෝකනයේදී, අප පසුව සඳහන් කරන පරිදි, කවුට්ස්කි විසින් වර්ධනය කල සමහර සංකල්පවල, විශේෂයෙන්ම කම්කරු පන්තිය හා රාජ්‍ය අතර සෘජු ගැටුමක ගම්‍යයන් පිලිබඳව, ඔහු ලිවූ දේ තුල, දේශපාලන දුබලතා හඳුනාගත හැකිය. එහෙත්, ඓතිහාසික අවශ්‍යතාවෙන් පිලිගැන්වුන ත්‍යාගයක් ලෙස, සැබෑ මිනිසා දැවැන්ත බලයක් සහිතව නැගී සිටින විප්ලවයේ සම්ප්‍රාප්තිය අපේක්ෂාවෙන්, අලස සුවයෙන් බලාසිටින එක්තරා වර්ගයක අමනෝඥ මහාචාර්ය ධුරන්දර හනමිටිකාරයන්, කවුට්ස්කි පිලිබඳව ගොඩනගා ඇති ඒකාකාර ප්‍රතිරූපයට මෙය මුලුමනින්ම වෙනස්ය. බොහෝ ශාස්ත්‍රාලික විවේචකයන්ට අනුව, ඔහු සන්තකයේ තිබුනේ යයි සලකන ලද දේශපාලන ඉරනම්වාදයට එරෙහිව, කවුට්ස්කි "විප්ලවවාදී ප්‍රශ්න" නමින් 1904 පෙබරවාරියේ ප්‍රකාශයට පත්කල ලිපියක් තුල වාද කලේය.

> සමාජ අවශ්‍යතාවය සඳහා එය අවශ්‍යවන නමුත්, සෑම විටම විප්ලවයේ ජයග්‍රහනයට තුඩුදෙන පරිදි ලෝකය ඕනෑකමින්ම සංවිධානය වී නොමැත.

කම්කරුවන්ගේ ජයග්‍රහනය හා ඒ පසුපසින් සමාජවාදයේ පැමිනීම ගැන අප කථා කරන විට එයින් අදහස් කරන්නේ, අපගේ බොහෝ විවේචකයන් සිතන පරිදි ජයග්‍රහනය නොවැලැක්විය හැකි හෝ ක්ෂනික බවක් හෝ විප්ලවවාදී පන්තිය නිෂ්ක්‍රීයව සිටියදී පවා එය ස්වයංක්‍රීයව හා ඉරනම්වාදී නිශ්චිත භාවයකින් සිදුවන්නේය යන්න නොවේ. අවශ්‍යතාවය මෙහිදී වටහාගත යුත්තේ, තවදුර වර්ධනයේ එකම ශක්‍යතාව වන්නේ විප්ලවය පමනක්ය යන අර්ථයෙනි. එහිදී කම්කරුවන් සිය සතුරන් පරාජය කිරීමට අසමත් වන අවස්ථාවේදී සමාජයට තවදුරටත් වර්ධනය වීමේ හැකියාවක් නැත. එය එක්කෝ එකතැන පල්විය යුතුය, නැතහොත් කුනුවී යා යුතුය. (10)

1889 ලියන ලදුව 1905 යලි ප්‍රකාශයට පත්කල "The *Sans-Culottes* of the French Revolution" නම් තවත් රචනාවක් තුල විප්ලවකාරී ත්‍රස්තවාදය පිලිබඳ සැබෑ ප්‍රශස්තියක් ඇතුලත්ව තිබේ. කවුට්ස්කිට අනුව, ජැකොබින් තන්ත්‍රයේ ත්‍රස්තවාදය "සැඟවුනු අභ්‍යන්තර සතුරා භීතියට පත්කර තැතිගැන්වූ, යුද්ධයේ අවියක් බවට පත්වීමට වඩා, විප්ලවයේ ආරක්ෂකයන් තුල විශ්වාසය දල්වමින්, බාහිර සතුරාට එරෙහිව සිය අරගලය ගෙනයාමට සේවයක් සැලසී ය." (11)

දේශපාලනය තුල ආත්මීය සාධකයේ ක්‍රියාකලාපය පිලිබඳ මොනයම්ම හෝ හැඟීමකින් තොර කවුට්ස්කි, "ග්‍රාම්‍ය" ඇට්ටරයෙක් වීය යන ප්‍රකාශය ගැන කිව හැක්කේ කුමක් ද? ජනතා ක්‍රියාවන් අභිප්‍රේරනය කරන බලවේග පිලිබඳ ඔහුගේ සංකල්පය හඳුනා ගත්තේ, නිස්සාර හා අපුද්ගලික ආර්ථික ආවේශයන් ලෙසය. කම්කරු පන්තියේ දේශපාලන ක්‍රියාකාරකම් තුල අවේගයන්ට හා පරමාදර්ශයන්ට කිසිදු වැදගත් භූමිකාවක් ඉටුකිරීමට ඉඩ සැලස්වීමට ඔහු අසමත්වී ද? කවුට්ස්කි පිලිබඳ මෙවන් ඒකාකාරී ප්‍රතිරූපයක් පිලිගනු ලබන අය, එක්සත් ජනපද සමාජවාදී ව්‍යාපාරයේ දුබලකම් තුල, ඇමරිකානු කම්කරුවන් අතර "විප්ලවවාදී අද්භූතාලංකාරයේ" හිඟකම මෙන්ම, "ආත්මයෙන්ම අතිශයින් දූෂ්‍ය ධනවාදය" පිලිබඳව බුද්ධිමතුන් අතර පැතිර තිබූ උදාසීනත්වය, වැදගත් සාධකයන් වූ බව ඔහු සැලකිල්ලට ගත්බව දැනගත්කල මවිතයට පත්වනු ඇත. (12)

සංග්‍රහය පැහැදිලි කරන පරිදි, රුසියානු කටයුතු තුල කවුට්ස්කිගේ මැදිහත්වීම, හුදෙක් සිය තරුන සහෝදරවරු සාර් ප්‍රධානත්වය දැරූ මෘග ලෙස ප්‍රතිගාමී වූ පොලිස් රාජ්‍යයට එරෙහිව යෙදී සිටි ජීවිතයත් මරනයත් අතර සටනේ වේදනාවන් පිලිබඳව උනුවෙන හදක් ඇති මාමන්ඩියෙකුගේ කනස්සල්ල පිලිබඳ ප්‍රකාශනයක් නොවීය. විශේෂයෙන්ම රුසියානු-ජපන් යුද්ධයෙන් හා 1905 විප්ලවයේ පැන නැඟීමෙන් ඉක්බිත්තෙහි රුසියාව තුල සිදුවීම්, කවුට්ස්කි හා එවකට ඔහුගේ සමීප සගයා වූ රෝසා ලක්සම්බර්ග් විසින් දැකගනු ලැබුවේ, ජර්මානු සමාජවාදී ව්‍යාපාරයට තීරනාත්මක වන සිදුවීම් ලෙසය.

ලක්සම්බර්ග් මෙන්ම කවුට්ස්කි ද ජර්මානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂයේ (එස්පීඩී) දේශපාලන පිලිවෙත තීන්දු කිරීමේ දී වෘත්තීය සමිතිවල වැඩෙන අධිකාරය පිලිබඳව ගැඹුරින්ම කනස්සලු වූහ. 1903 සැප්තැම්බරයේ ඩ්‍රෙස්ඩෙන්හි පැවති පක්ෂ සමුලුවේදී එඩුවාඩ් බර්න්ස්ටයින්ගේ සංශෝධනවාදය පරදවා සම්භාව්‍ය මාක්ස්වාදීන් ලැබූ විධිමත් ජයග්‍රහනය තිබියදී ම, වෘත්තීය සමිති විසින් එල්ල කෙරුනු පීඩනය, එස්පීඩීය (සමාජ ප්‍රජාතන්ත්‍රවාදී පක්ෂය) විප්ලවවාදී ව්‍යාපාරයක් ලෙස පැවතීම සම්බන්ධයෙන් වඩාත් බලගතු අන්තරායක් මතුකලේය. 1905 විප්ලවයේ පුපුරායාම පක්ෂය තුල දේශපාලන ගැටුම උත්සන්න කලේය.

රුසියාවේ මහා වැඩවර්ජන එස්පීඩී වාමාංශයේ නායකයින් විසින් දැකගනු ලැබුවේ, ජර්මනිය තුල විප්ලවවාදී අරගලයේ නව ජීවයක හා ස්වයං කැපකිරීමේ පනිවිඩය ලෙසය. පසුකාලයක දී අන්ත සංශෝධනවාදියෙකු බවට පත්වූ රුඩොල්ෆ් හිල්ෆර්ඩිං පවා රුසියානු කැලඹීමෙන් අනුප්‍රානයක් ලැබීය. ඔහු 1905 නොවැම්බර් 14 දින කවුට්ස්කි වෙත මෙසේ ලියා දැන්වීය. "සාර්වාදයේ බිඳ වැටීම අපගේ විප්ලවයේ ආරම්භයයි, අපගේ ජයග්‍රහනයයි, එය දැන් ලං ලංවම පැමිනෙමින් තිබේ. 1848 දී ඉතිහාසයේ චලනය පිලිබඳව මාක්ස් වැරදීමකින් ප්‍රකාශයට පත්කල බලාපොරොත්තුව, දැන් සාක්ෂාත් වනු ඇතැයි අපි අපේක්ෂා කරන්නෙමු." (13)

මහජන අරගල පිලිබඳව කවුට්ස්කි ඊටත් වඩා උද්යෝගිමත් විය. ඔහු 1905 ජූලි මාසයේදී මෙසේ ලිවීය. "රුසියානු කම්කරුවන්ට හරියටම අවශ්‍ය වන්නේ නොනවතින විප්ලවයයි" (14) "විප්ලවවාදී වර්ධනයේ අවධියක් ඇරඹී තිබේ. මෙහිටි, වේදනාකාරී ලෙස, මුලුමනින්ම පාහේ ගෝචර නොවන ලෙස සිදුවන වර්ධනයේ යුගය, විප්ලවයන්ගේ, එනම් හදිසි ඉදිරි පිම්, සමහරවිට කඩින් කඩ ඇතිවන මහා පරාජයන්, එහෙත් කම්කරු පන්තිය පිලිබඳව අප තුල තිබිය යුතු විශ්වාසයට අනුව අවසානයේ සුවිශාල ජයග්‍රහනයේ, අවධියකට ඉඩ හරිනු ඇත. (15)

එහෙත් එස්පීඩී තුල සටන්කාමී ප්‍රවනතාවන්හි ජීවගුනය ඔසවාලූ විප්ලවය, වෘත්තීය සමිති නායකත්වය භීතියෙන් හා තැතිගැන්මෙන් මුසපත් කලේය. රුසියානු සාදෘශ්‍යයේ බලපෑමෙන් බියපත් සමාජ ප්‍රජාතන්ත්‍රවාදී නිදහස් වෙලඳ සංගමය 1905 මැයි මාසයේ කොලොන්හි

පැවැත්වූ පස්වන සමුලුවේදී මහා වැඩ වර්ජන හා එමගින් දිරිගන්වන උද්ඝෝෂන තහනම් කලේය. එස්පීඩී සභාපති ඕගස්ට් බේබල් "පාරිශුද්ධ හා සරල" වෘත්තීය සමිතිවාදයට පහරදුන් අතර 1905 සැප්තැම්බරයේ ජෙනා නුවර පැවත්වූ පක්ෂ සමුලුව විසින් සම්මත කල ප්‍රජාතන්ත්‍රීය අයිතීන් සඳහා සටන්වැදීමේ මහා වැඩවර්ජන පිලිබඳ යෝජනාව අනුමත කලේය.

කෙසේ වෙතත් එස්පීඩී හා වෘත්තීය සමිති අතර බල තුලනය පූර්ව දශකය පුරා පක්ෂයේ අවාසියට හේතුවන පරිදි බෙහෙවින් වෙනස්වී තිබුනි. ඒවාට අරමුදල් සපයන ලද්දේ පක්ෂ නායකත්වය යටතේ වුවත්, ඒවායේ සාමාජිකත්වය ඉහල නැගි හා ඒවායේ බැංකු ගිනුම් තරවූ තතු හමුවේ වෘත්තීය සමිති, සුවිශේෂී හා තීරනාත්මක විප්ලව විරෝධී අවශ්‍යතාවන් විසින් ගිලගනු ලැබිනි. වෘත්තීය සමිති කථකයෙක් වූ තියඩෝර් බොමෙල්බර්ග් එක එල්ලේ පල කලේ, සියල්ලටමත් වඩා තමන්ට අවශ්‍ය "සාමය හා නිස්කලංකය" බවයි. (16) 1905 වන විට වෘත්තීය සමිතිවල වාර්ෂික ආදායම එස්පීඩීය ට වඩා දල වශයෙන් පනස් ගුනයකින් වැඩිය. එස්පීඩීය එන්ට එන්ටම වෘත්තීය සමිතිවල අරමුදල් මත යැපෙන තාක් දුරට එය, ඒවායේ ගොදුරක් බවට පත්විය. තවද, බේබල් වැනි පලපුරුදු එස්පීඩී නායකයෝ, වෘත්තීය සමිති, පක්ෂයෙන් බිඳී ප්‍රති-විප්ලවවාදී "කම්කරු" පක්ෂයේ සංශෝධනවාදී කොටස් සමග සන්ධානගතවීමේ හැකියාව ගැන දැනුවත් වූහ. මෙම තත්වය, එස්පීඩීය මත ප්‍රචන්ඩ ප්‍රහාරයක් සඳහා රාජ්‍යයට කොන්දේසි සකසනු ඇත. වෘත්තීය සමිති මධ්‍යස්ත කරගැනීම සඳහා එස්පීඩී නායකත්වයට එල්ලවූ පීඩනය ඉමහත් විය. ජෙනා සමුලු යෝජනාවෙන් මහා වැඩවර්ජන පිලිබඳව ඉඩකඩ ලැබී තිබියදී වුවත්, එස්පීඩී විධායකයෝ වෘත්තීය සමිති පොදු කමිටුව සමඟ රහසිගතව රැස්වූහ. එස්පීඩීය මහා වැඩවර්ජනයක් වැලැක්වීම සඳහා කල හැකි හැම දෙයක්ම කල යුතු යයි වෘත්තීය සමිති විසින් කල ඉල්ලීමට බේබල් යටත් විය." (17) දේශපාලන වැඩවර්ජනයක අවස්ථාවකදී වෘත්තීය සමිති එයට දෙන සහයෝගය අත්හිටුවන බවට පොදු කොමිසම එස්පීඩීයට අනතුරු ඇඟවීය. වෘත්තීය සමිති වෙතින් පිරිනැමුනු එකම සහනය වූයේ ඔවුන් වැඩවර්ජනය කඩාකප්පල් කිරීමට විවෘතව කටයුතු නොකරන බවට දුන් පොරොන්දුවයි. පන්ති සම්බන්ධතා රැඩිකලීකරනයට තර්ජනය කරන මොනම දෙයකට හෝ වෘත්තීය සමිති නායකත්වයෙන් පලවූ කටුක විරුද්ධත්වය හමුවේ මෙම සහනය මත එස්පීඩීය වැඩි විශ්වාසයක් තැබූ බව සැක සහිතය.

මෙම අවධිය කවුට්ස්කිගේ දීර්ග විප්ලවවාදී කාර්යසාධනයේ උච්චතම අවස්ථාව විය. වෘත්තීය සමිති නායකත්වයේ කටුක ප්‍රහාරවලට එරෙහිව ඔහු රෝසා ලක්සම්බර්ග් ආරක්ෂා කල අතර, ඒ වෙනුවෙන් ඇය ඔහුව ලෙන්ගතුව අගය කලාය. ඇය ඔහු හැඳින්වූයේ "කාර්ලොස් මැග්නස්" "Karolus Magnus" හෙවත් මහා කාල් යනුවෙනි. පෞද්ගලික ලිපි හුවමාරුවකදී කවුට්ස්කි, පසුකාලීනව තමන්ගේ දකුනට පැදීම, වෘත්තීය සමිතිවල හොඳ හිත දිනාගැනීමේ ප්‍රයත්නයක් ලෙස යුක්තිසහගත කල අතර ඔහු කෙරෙහි ලක්සම්බර්ග් තුල පහලවූ දැඩි අපේක්ෂා භංගය හා කෝපය වටහාගත හැක්කේ ඔවුන්ගේ දිගු කාලීන සම්බන්ධකම්වල පසුබිම තුලය.

සැබවින්ම මෙම සංග්‍රහයට, රුසියානු සමාජ ප්‍රජතන්ත්‍රවාදී ලේබර් පක්ෂය (ආර්එස්ඩීඑල්පී) තුල සාකච්ඡාවට භාජනය වූ වැදගත් ලේඛන අඩංගු වෙයි. එවා අතර, රියාසනොව් යන පක්ෂ නාමයෙන් හැඳින්වූ ඩේවිඩ් බොරිසොවිච් ගොල් ඩෙන්ඩාක් විසින් ලියන ලද ලේඛන දෙකක් ද වෙයි. 1870 ඔඩෙස්සා වල උපත ලැබූ ඔහු, පසු කාලයේදී වෙහෙස නොබලා වැඩකල ඉතිහාසඥයෙක් හා මාක්ස් හා එංගල්ස්ගේ සාහිත්‍යමය උරුමය පිලිබඳ ලේඛනාරක්ෂකයෙක් ලෙස සුප්‍රකට විය. බොල්ශෙවික් විප්ලවයෙන් පසුව ඔහු, රාජ්‍ය ලේඛනාගාර සංගමයේ ප්‍රධානියා බවට පත්විය. ඔහු සමාජවාදී අධ්‍යාපන පීඨය හා මාක්ස් එංගල්ස් ආයතනය පිහිටුවීමට ද සම්බන්ධ විය. බටහිර යුරෝපයේ සංචාරය කල ඔහු විවිධ සමාජ ප්‍රජාතන්ත්‍රවාදී නිලධරයන් සමඟ සාකච්ඡා කර මාක්ස් හා එංගල්ස්ට සම්බන්ධ ලිපි ලේඛන සම්භාරයක් රැස්කර ගත්තේය.

මෙම දක්ෂ මාක්ස්වාදී විද්වතා විප්ලවවාදී න්‍යායාචාර්යවරයෙක් ලෙස ද සැලකිය යුතු කාර්ය සාධනයකට හිමිකම් කියයි. ට්‍රොට්ස්කි මෙන්ම ඔහු ද බොල්ශෙවික් හා මෙන්ෂෙවික් කන්ඩායම් වලින් බැහැරව සිටියේය. 1917 වසරේ ග්‍රීෂ්මයේදී බොල්ශෙවික් පක්ෂයට බැඳෙන තෙක්ම, එම වසර තුල යලිත් ඔහු ට්‍රොට්ස්කි මෙන්ම *මෙස්රෙයොන්කා* නමැති අන්තර් දිස්ත්‍රික්ක සංවිධානයේ සාමාජිකයෙක්ව සිටියේය. බොල්ශෙවිකයන් බලය අල්ලාගැනීමෙන් ඉක්බිත්තෙහි රියාසනොව්ගේ ක්‍රියාකලාපය තුල මෙන්ෂෙවිකයන් කොටසක් සමඟ පොදු එකඟතාවක් ඇතිකර ගැනීමට දැරූ උත්සාහය කැපී පෙනුනු අතර එය, *බොල්ශෙවිකයෝ බලයට පත්වෙති* (ඉන්ඩියානා යුනිවසිටි ප්‍රෙස් 2007) යන ඇලෙක්සැන්ඩර් රබිනොවිච් ගේ කෘතියෙහි බරැරුම් ශාස්ත්‍රාලික විමසුමකට ලක්විය. රියාසනොව්ගේ දිගු විප්ලවවාදී කාර්යසාධනය, මාක්ස්වාදී න්‍යාය හා සමාජවාදී ව්‍යාපාරයේ ඉතිහාසය පිලිබඳ ඔහුගේ ප්‍රගාඪ දැනුම හා පුලුල් සංස්කෘතික ආසක්තයන්, සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමයේ (සෝසසසං) විප්ලවකාරී මාක්ස්වාදී බුද්ධිමතුන් විනාශ කිරීමේ ස්ටැලින්ගේ ව්‍යාපාරයෙහි පලමු හා අනිවාර්ය ඉලක්කයක් බවට ඔහුව පත්කලේය. 1931 පෙබරවාරියේදී රියාසනොව් පලමු වරට අත්අඩංගුවට ගනු ලැබූ අතර "මෙන්ෂෙවික් මධ්‍යස්ථානයේ"

කොටස්කරුවෙකුව සිටි බවටත්, "ඓතිහාසික පෙරමුනේ කටයුතු කඩාකප්පල් කල" බවටත් චෝදනා එල්ල කරන ලදී. ට්‍රොට්ස්කි මෙසේ ලිවීය. "රියාසනොව්, ඔහුගේ පුද්ගලික අවංකභාවයේ ගොදුරක් බවට පත් විය." (18) පක්ෂයෙන් නෙරපා හැර සරටොව් වෙත පිටුවහල් කරන ලද රියාසනොව් 1937 දී යලි අත් අඩංගුවට ගනු ලැබීය. 1938 ජනවාරි 21 දින ඔහු ඊනියා මිලිටරි කොලීජියම් ආයතනය විසින් ජීවිතාන්තය දක්වා සිරගෙට නියම කිරීමෙන් පසුව එදිනම වෙඩිතබා මරා දැමුනි.

1902-03 කාලයේ රචිත, *ඉස්ක්‍රාවේ කෙටුම්පත් ක්‍රියාමාර්ගය හා රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදීන්ගේ කර්තව්‍යයෝ* නමැති රියාසනොව්ගේ ප්‍රථම ලේඛනය මෙම සංග්‍රහය තුල අඩංගුවේ. පිටු 302 පුරා දිවයන මුල් ලේඛනයේ දිග කම ගැන සඳහන් කරන ඩේ හා ගයිඩෝ, වටහාගත හැකි පරිදිම ඉදිරිපත් කිරීමට තෝරාගෙන ඇත්තේ තෝරාගත් කොටස් පමනි. 1903 සැප්තැම්බරයේදී ආර්එස්ඩීඑල්පී දෙවන සමුලුවේදී පැන නැගුනු භේදය පෙර සලකුනු කල කන්ඩායමික ගැටුම්වල තීව්‍රත්වය ප්‍රත්‍යාවලෝකනයේදී පිලිබිඹු කරන එය, සිත් ඇදගන්නා ලේඛනයක් විය. තවද, එලඹෙන රුසියානු විප්ලවයේ අවශ්‍යයෙන්ම ගන්නා ධනේශ්වර ස්වභාවය හා ආකෘතිය පිලිබඳ ප්ලෙකානොව්වාදී සංකල්පය සමග පැවති නොඑකගතාවය මෙම ලේඛනය නිසැකවම පෙන්නුම් කරයි. කෙසේ වෙතත් මෙම විශ්ලේෂකයා (ඩේවිඩ් නෝර්ත්) විශ්වාස කරන්නේ, ඩේ හා ගයිඩෝ, "ඉස්ක්‍රා වැඩපිලිවෙල පිලිබඳ රියාසනොව්ගේ විවේචනය වැදගත් වන්නේ, එහි සෑම විස්තරයකින්ම පාහේ නොනවතින විප්ලවයේ න්‍යාය පූර්වාපේක්ෂාකිරීම නිසා" (19) යයි පැවසීමෙන් ප්‍රශ්නය අතිශයෝක්තියට නගා ඇති බවයි.

විප්ලවයෙන් ඉක්බිත්තෙහි ධනේශ්වර පාලනයට යටත්වීම පිලිබඳ ප්ලෙකානොව්ගේ සංකල්පයෙන් ඔබ්බට ගමන් කරන ආකාරයෙන් කම්කරු පන්තියේ කර්තව්‍යයන් නිර්නය කිරීමට රියාසනොව් දැරූ උත්සාහය තුල සැබවින්ම නිශ්චිත සූත්‍රගතකිරීම් දක්නට තිබේ. විප්ලවවාදී අරගලය තුල ගොවිජනතාව වැදගත් ස්වාධීන ක්‍රියාකලාපයක් ඉටුකරනු ඇති බවට පලව තිබූ අදහස් පිලිබඳව ද රියාසනොව් දැක්වූයේ සැකමුසු ආකල්පයකි. මෙය පසුකාලයකදී ට්‍රොට්ස්කි හා පාවුස්ගේ ලේඛන තුල වඩා බලගතු ලෙස පොහොසත් කරන ලදී

කෙසේ වෙතත්, බලයට පත්වන විප්ලවවාදී තන්ත්‍රයේ ස්වභාවය පිලිබඳ රියාසනොව්ගේ සූත්‍රගතකිරීම් යම් ආකාරයක අනිශ්චිත බවක් දරා සිටියි. විප්ලවය, "හටගන්නේ අවිවාදිතවම නිෂ්පාදනයේ ධනේශ්වර සම්බන්ධතාවන්ගේ පදනම මත වන බැවින් ඒ අර්ථයෙන් එය නිසැකම 'ධනේශ්වරයේ'..." එහෙත් "ආරම්භයේ සිට අවසානය දක්වාම එහි ප්‍රමුඛ බලවේගය කම්කරු පන්තිය වනු ඇති බැවින් හා එහි පන්ති ලාංඡනය සමස්ත ව්‍යාපාරය මතම තබනු ඇති බැවින් එය කම්කරු පන්තිකයේ" යයි ඔහු ලිවීය. (20) ලේඛනයේ තවත් තැනක ඔහු මෙසේ අවධාරනය කරයි. "ප්‍රජාතන්ත්‍රවාදී සමූහාන්ඩුවක් යනු, කම්කරු පන්තිය ධනේශ්වරයට එරෙහිව ගෙනයන පන්ති අරගලයේ වර්ධනය වන ආකෘතියයි." (21) කම්කරු පන්තිය සිය ලාංඡනය විප්ලවය මත තබනවා පමනක් නොව රාජ්‍ය බලය ද අල්ලා ගන්නවා ඇතැයි තර්ක කල ට්‍රොට්ස්කි විසින් පසුව ගෙනහැර දැක්වූ සූත්‍රගතකිරීම්වලට වඩා මේවා සැලකිය යුතු තරම් පසුපසින් ගැටීය.


රියාසනොව්ගේ ලේඛනයෙහි දුබලතම කොටස් ඇතුලත් විශාල පදාසයක් කැපකර ඇත්තේ ලෙනින්ගේ *කල යුත්තේ කුමක් ද?* කෘතියට පහරදීමටයි. විශේෂයෙන්ම, කම්කරු පන්තිය තුල සමාජවාදී විඥානය ස්වයංසිද්ධ ආකාරයකට වර්ධනය නොවන අතර එය කම්කරු පන්තිය තුලට පිටතින් ගෙනආ යුතු යයි ලෙනින් යෙදූ අවධාරනයටයි. "ලෙනින් සහෝදරයා ඕනෑවට වඩා දුරක් යයි." මෙම අදහසට එරෙහිව බලගතු විවාදයක් දියත් කරමින් රියාසනොව් එසේ ලිවීය. ඩේ හා ගයිඩෝගේ විස්තර කථනය ඇඟවුම් කරන්නේ, ඔවුන් යම් දුරකට රියාසනොව්ගේ ආස්ථානය කෙරෙහි සානුකම්පික බවයි. කෙසේ වෙතත් හරියටම මෙම ප්‍රශ්නය, එනම්, කම්කරු පන්තිය තුලට සමාජවාදය ගෙන එන්නේ එහි ස්වාභාවික ආර්ථික අරගලයන්ගේ හා ප්‍රායෝගික කටයුතු පිලිබඳ ක්ෂේත්‍රයෙන් නොවේය යන්න තුල, ලෙනින් කෙරෙහි කෞට්ස්කිගේ බලපෑම වඩාත් ප්‍රකට කෙරෙයි. "සමාජවාදී විඥානය යනු, කම්කරු පන්ති අරගලය තුලට හඳුන්වාදෙන කිසිවක් නොවන අතර එය තුලින් ස්වයංසිද්ධව නැගී එන කිසිවක් ද නොවේ." (22) සංශෝධනවාදය පිලිබඳ ඔහුගේ විරුද්ධත්වය තිබියදීම, සමහර තීරනාත්මක විෂයන්හිදී රියාසනොව්ගේ ලේඛනයෙන් ඉදිරිපත් කරන ආස්ථාන, සමාන වන්නේ ආර්ථිකවාදීන්ටය. එහි ප්‍රධාන ඉලක්කය *කල යුත්තේ කුමක් ද?* ය.

ඩේ හා ගයිඩෝ සඳහන් කරන පරිදි, 1970 දී ලියන ලද එක් ඉතිහාසඥයෙක් රියාසනොව්ගේ ඉස්ක්‍රා විවේචනය විස්තර කලේ "විප්ලවවාදී ආර්ථිකවාදය" ලෙසය. (23)

දල වශයෙන් තෙවසරකට පසුව, 1905 විප්ලවය මධ්‍යයේ ලියන ලද රියාසනොව්ගේ දෙවන ලේඛනයට, ට්‍රොට්ස්කි හා පාවුස් විසින් වර්ධනය කරන ලද සූත්‍රගතකිරීම් වලට වඩාත් සමීප සූත්‍රගතකිරීම් ඇතුලත්ව තිබේ. "දේපල පිලිබඳ ප්‍රශ්නයේ" කේන්ද්‍රීය වැදගත්කම අවධාරනය කරමින් රියාසනොව් මෙසේ ප්‍රකාශ කලේය:

> තමන්ගේම කර්තව්‍යයන් පරිපූර්නත්වයකට ගෙන ඒමට දරන සියලු උත්සාහයන් සංකේන්ද්‍රනය කරන එය, එනම් කම්කරු පන්තිය, ප්‍රශ්නය වනාහි තාවකාලික ආන්ඩුවට සහභාගී වීම නොව කම්කරු පන්තිය විසින් බලය අල්ලාගෙන 'ධනේශ්වර' විප්ලවය සමාජ විප්ලවය සඳහා සෘජු ප්‍රස්තාවනාවක් බවට පෙරලීමය යන අවස්ථාව කරා එක විටම ලඟාවෙයි. (24)

රුසියානු විප්ලවයේ න්‍යාය හා මූලෝපායෙහි පරිනාමය තුලදී, ප්ලෙකානොව්ගේ සම්භාව්‍ය සංකල්පයට ප්‍රධාන විකල්පයක් ලෙස "කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වය" පිලිබඳ ලෙනින්ගේ සංකල්පය 1905 දී මතුව ආවේය. ලෙනින්ගේ ඉදිරිදර්ශනය මූලික විෂයන් දෙකකදී ප්ලෙකානොව්ගෙන් වෙනස් විය. ඒ දෙකෙහිම දුරදිග යන දේශපාලන හා ප්‍රායෝගික ඇඟවුම් ගැබ්ව තිබුනි. පලමුවෙන්ම, එලඹෙන්නේ ධනේශ්වර විප්ලවයක් යයි ලෙනින් අංගලක්ෂනය කලේ වී නමුත්, මෙම විප්ලවය එහි තීරනාත්මක අවසානය කරා ගෙනයාම කෙසේ වෙතත්, එය මෙහෙයවීමේ හැකියාව පවා රුසියානු ධනේශ්වරයට ඇතැයි යන්න ප්‍රතික්ෂේප කලේය. ප්ලෙකානොව්ට සපුරා වෙනස් ලෙස, ධනේශ්වර ලිබරලුන් සමඟ කුමන හෝ දේශපාලන සන්ධානයක් ලෙනින් එකහෙලා ප්‍රතික්ෂේප කලේය. තවද ලෙනින්ට අනුව, "ධනේශ්වර" විප්ලවයේ අත්‍යවශ්‍ය ඓතිහාසික වැදගත්කම රැඳී පැවතියේ, ප්‍රජාතන්ත්‍රවාදී පාර්ලිමේන්තු ආයතන පිහිටුවීම තුල නොව, ගම්බද පැවති සියලු වැඩවසම් සම්බන්ධයන්ගේ අවශේෂයන් පෙරලිකාරී ලෙස වනසා දැමීම තුලය. ලෙනින්, "කෘෂිකාර්මික ප්‍රශ්නය" ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ හරි මැදට ගෙනාවේ එබැවින්ය. නොනවතින විප්ලව න්‍යායේ මූලාරම්භය පිලිබඳව සිය අවසාන ප්‍රධාන ලේඛනය තුල ට්‍රොට්ස්කි මෙලෙස අවධාරනය කලේය. "ප්ලෙකානොව්ට වඩා අපරිමිත මහා බලයක් හා ස්ථාවරත්වයක් සහිතව ලෙනින්, කෘෂිකාර්මික ප්‍රශ්නය රුසියානු විප්ලවයේ කේන්ද්‍රීය ගැටලුව ලෙස ඉදිරිපත් කලේය." (25)



**ලෙනින්**

මෙම විශ්ලේෂනයෙන්, ප්ලෙකානොව්ට මුලුමනින්ම වෙනස්වූ දේශපාලන මූලෝපායක් මතුව ආවේය. ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ ජයග්‍රහනය ගම්බද පැරනි ඉඩම් හිමි පන්තියේ විහාල භූමිභාගයන් අත්පත්කර ගැනීම සමඟ බැඳී තිබුනු අතර, එය සාක්ෂාත් කල හැකි වූයේ දශ ලක්ෂ සංඛ්‍යාත රුසියානු ගොවීන් දැවැන්ත පරිමානයකින් බලමුලු ගැන්වීමෙන් පමනි. පෞද්ගලික දේපලට එරෙහිව යොමුකල මොනම අන්දමක හෝ ජනතා ක්‍රියාවලියකට සතුරුවූ රුසියානු ධනේශ්වරයට, ගම්බද පැවතීගෙන ආ දේපල සම්බන්ධතා විප්ලවකාරී ලෙස පෙරලා දැමීමේ කටයුත්ත මෙහෙයවීමට හෝ ඊට සහාය දීමට හෝ පුලුවන්කමක් නොතිබුනි. රුසියානු ජනගහනයේ අති මහත් බහුතරය සැදූමලත් ගොවිජනතාව එලෙස බලමුලු ගැන්වීමෙන් තොරව සාර්වාදී තන්ත්‍රය පෙරලා දැමිය නොහැකි විය.

එබැවින්, ලිබරල් ධනේශ්වරය වෙත ප්ලෙකානොව්ගේ දිශානතියෙහි අර්ථය විප්ලවයේ මරනය යයි ලෙනින් සැලකීය. සාර්වාදී තන්ත්‍රයට එරෙහි විප්ලවවාදී අරගලයේදී අනිවාර්යයෙන්ම කම්කරු පන්තියේ හවුල්කරුවා වූයේ ගොවි ජනතාවයි. සාර්වාදී ආඥාදායකත්වයට එරෙහිව පිහිටුවිය යුතු විප්ලවකාරී රාජ්‍ය බලයේ නව ආකෘතිය පිලිබඳ සිය සංකල්පය ලෙනින් විසින් වර්ධනය කරන ලද්දේ ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ ගතිකයන් පිලිබඳ මෙම තක්සේරුව තුලිනි. එනම්, *කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වය* යි.

ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය පිලිබඳ ලෙනින්ගේ සංකල්පය, රුසියානු සමාජ ප්‍රජාතන්ත්‍රවාදී ලේබර් පක්ෂයේ (1912 වන තෙක් බොල්ශෙවිකයන් තමන් ස්වාධීන පක්ෂයක් ලෙස ප්‍රකාශයට පත් නොකලේය.) බොල්ශෙවික් කන්ඩායම, සාර් පෙරලා දැමීමේ එකම නීත්‍යානුකුල දේශපාලන ප්‍රතිපලය වන්නේ ලිබරල් ධනේශ්වර පාර්ලිමේන්තු සමූහාන්ඩුවක් යයි එක් හෝ වෙනත් ආකාරයකින් අවධාරනය කල සියලු මෙන්ශෙවික ප්‍රවනතාවන්ට හා ධනේශ්වරයට අශමනීය දේශපාලන විරුද්ධත්වයක පිහිටුවාලීය. කෙසේ වෙතත් ලෙනින්, ප්‍රජාතන්ත්‍රවාදී හා සමාජවාදී විප්ලවයන් පැහැදිලි ලෙස බෙදා වෙන් කලේය. ලෙනින් සූත්‍රගතකල පරිදි කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වය පිහිටුවිය යුත්තේ ධනේශ්වර සම්බන්ධතාවන්ගේ පදනම මතය. 1905 දී ඒ පිලිබඳව ලියමින් ලෙනින් මෙසේ පැහැදිලි කලේයː

> එහෙත් සැබවින්ම එය, ප්‍රජාතන්ත්‍රවාදී මිස සමාජවාදී ආඥාදායකත්වයක් නොවනු ඇත. විප්ලවවාදී වර්ධනයේ අතරමැදි අවධීන් මාලාවකින් තොරව, ධනවාදයේ පදනම් කෙරෙහි බලපෑමට එයට නොහැකිවනු ඇත.

> උපරිම වශයෙන් එය, ගොවිජනතාවට වාසිවන පරිදි ඉඩම් දේපලෙහි පෙරලිකාරී යලි බෙදාහැරීමක් සිදුකරනු ද, සමූහාන්ඩුවක් පිහිටුවීම ද ඇතුලත් අඛන්ඩ හා පූර්න ප්‍රජාතන්ත්‍රවාදය පිහිටුවනු ද, ගම්බද පමනක් නොව කම්හල් ජීවිතය තුල ද ආසියාතික වහල්භාවයේ සියලු පීඩාකාරී අංග අතුගා දමනු ද, කම්කරුවන්ගේ ජීවන තත්වය ඉහල නැංවෙන ආකාරයෙන්, කම්කරුවන්ගේ ජීවන කොන්දේසිවල ඉහල ප්‍රගතියක් සඳහා පදනම දමනු ද, අවසාන එහෙත් වැදගත් කමෙන් නොඅඩු, විප්ලවකාරී කලබැගෑනිය යුරෝපය තුලට ගෙනයනු ද ඇත. එවන් ජයග්‍රහනයක් පවා කිසිදු අර්ථයකින් අපගේ ධනේශ්වර විප්ලවය සමාජවාදී විප්ලවයකට පරිවර්තනය නොකරනු ඇත. ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය ධනේශ්වර සමාජ ආර්ථික සම්බන්ධතාවන්ගේ බැඳීම් ක්ෂනිකවම ඉක්මවා නොයනු ඇත. එසේ වුවත්, රුසියාවේ මෙන්ම සමස්ත ලෝකයේම අනාගත සංවර්ධනය සඳහා එවන් ජයග්‍රහනයක වැදගත්කම ඉමහත් වනු ඇත. (26)

ට්‍රොට්ස්කි පසුව ලිවූ පරිදි ලෙනින්ගේ ක්‍රියාමාර්ගය, ධනේශ්වර විප්ලවය පිලිබඳ ප්ලෙකානොව්ගේ සංකල්පයට ඔබ්බෙන් "දැවැන්ත ඉදිරි පිම්මක් නියෝජනය කලේය." (27) කෙසේ වෙතත් එය, ලෙනින්ගේ සූත්‍රගතකිරීමේ ව්‍යාකූලත්වයන් හා සීමාවන් හෙලිදරව් කල න්‍යායික හා දේශපාලන ප්‍රශ්න මාලාවක්ම ඉස්මතු කලේය. විශේෂයෙන්ම ලෙනින්ගේ සංකල්පය, බලය පන්ති දෙකක්, එනම්, කම්කරු පන්තිය හා ගොවීන් විසින් බෙදාගනු ලබන නව හා පෙර නොවූ විරූ රාජ්‍ය ආකෘතියක් පෙර දුටුවේය. මෙම පන්ති අතර බලය බෙදාහරිනු ඇත්තේ කෙසේ ද? තවද, ලෙනින් පැහැදිලිවම හඳුනාගත් පරිදි, පැරනි ඉඩම් යායවල් අහෝසි කර ඉඩම් යලි බෙදාහැරීමෙන් ඒවායේ පුද්ගලික අයිතිය අවසන් කෙරෙන බවක් අදහස් නොකෙරිනි. වඩා සාධාරන පදනමක වුවත් ගොවීන් පෞද්ගලික දේපලට බැඳී සිටිනු ඇත. කෙසේ වෙතත් ගොවීන්, පුද්ගලික දේපල විරෝධයට, සමාජවාදී අභිලාෂයන්ට හා කම්කරු පන්ති දිශානතියට සතුරුකම් පානු ඇත. පන්ති දෙකක සමාජ දිශානතිය තුල පවතින මෙම මූලික ප්‍රතිවිරෝධය, ලෙනින්ගේ ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වයේ වලංගු භාවය ප්‍රශ්නයට බඳුන් කලේය.

ලෙනින්ගේ ක්‍රියාමාර්ගයේ සීමාසහිතකම් තිබියේවී නමුත් එය, වෛෂයික ඓතිහාසික අර්ථයකින් රුසියානු විප්ලවවාදී චින්තනයේ වර්ධනය තුල වැදගත් සැතපුම් කනුවක් සලකුනු කලේය. එබැවින් මෙම විශ්ලේෂකයා (ඩේවිඩ් නෝර්ත්), ලෙනින්ගේ ආස්ථානය පිලිබඳව ඩේ හා ගයිඩෝ විසින් ගෙන තිබෙන නොසැලකිලිමත් හා බොහෝකොටම නොතකා හරින ආකල්පය ගැටලුවක් සේ සලකයි. මෙම එකම සිද්ධියේ දක්නට ලැබෙන්නේ දේශපාලන මත ගැටුම් (විචාරයට උඩින්) ඉදිරියට දමා ගැනීමකි. එය, නොනවතින විප්ලවයේ න්‍යාය පිලිබඳ විවාදය තුල පොදුවේ කතුවරුන් කර ඇති අනර්ඝ විමසුම දුබල කරයි. ඔවුහු මෙසේ සඳහන් කරති.

> කම්කරුවන්ගේ හා ගොවීන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වය පිලිබඳ ලෙනින්ගේ මතිය සමඟ පැවති ගැටලුව පැහැදිලිය. රුසියාවේදී, සහයෝගී විය හැකි විප්ලවවාදී සුලු ධනේශ්වර පක්ෂයක් නොතිබුනි. ලෙනින් කල්පනා කලේ අවසානයේදී එවන් පක්ෂයක් මතුව එනු ඇති බවයි. එහෙත් මෙය කෙසේවත්, දේශපාලන උපායන් පදනම් කල හැකි ප්‍රායෝගික මූලයක් නොවීය. (28)



*1902 දී ට්‍රොට්ස්කි*

මෙය යමෙකු විශ්මයට පත්කරන තීන්දුවකි. ලෙනින්ගේ න්‍යායෙහි සීමාසහිතකම් කවරක් වුවත්, ඒවා සුපැහැදිලි නොවීය. එසේ වූයේ නම්, "ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වයේ" න්‍යාය පිලිබඳ ට්‍රොට්ස්කිගේ ඉදිරිදර්ශනය හා නොනවතින විප්ලවයේ න්‍යාය මුල්කරගෙන ඉන් ඉක්බිතිව ඔහු කල ප්‍රතිපදානයන් කැපී පෙනෙන බුද්ධිමය ජයග්‍රහන ලෙස සැලකීම දුෂ්කර වනු ඇත. තවද, රුසියාව තුල මහා ගොවි පක්ෂයක ශක්‍යතාව විවෘතව තැබීම පිලිබඳව ලෙනින් මත වරද පැටවීම දුෂ්කරය. අස්ථාවර නමුදු, ගොවීන් අතර ජනතා පදනමක් ඇතිකරගත් සමාජවාදී විප්ලවවාදී පක්ෂයේ පසුකාලීන වර්ධනය, ලෙනින් නිවැරදි බව ඔප්පු කලේය. අවසාන වශයෙන්, සිහි තබාගැනීම වැදගත් කරුනක් නම් ලෙනින් අයත්වූයේ පැරිස් කොමියුනය විනාශ කිරීමෙන් ඉක්බිත්තේ දේශපාලන පරිනතභාවයට පැමිනි පරපුරට බවය. පැරිසියේ කම්කරුවන්ට ප්‍රන්සයේ ගොවීන් තමන්ගේ පැත්තට හරවා ගැනීමට නොහැකිවීම, 1871 මැයි මාසයේදී වර්සායිහි ධනපති පාලනයට කොමියුනය විනාශ කිරීමේ හැකියාව ලබාදුන් තීරනාත්මක සාධකය විය. එය, ක්ෂනයකින් අමතක කර දැමිය හැකි

දේශපාලන පරාජයක් නොවීය. ලෙනින්ට අනුව රුසියානු කම්කරු පන්තියේ ඉරනම, (ඒ අර්ථයෙන් විශාල කෘෂිකාර්මික ජනගහයක් සහිත කුමන රටක හෝ) ගොවි ජනතාවගේ සහාය දිනාගැනීමෙහි ලා එය සතු හැකියාව මත රැඳී පැවතුනි. හැම විටම ඓතිහාසික කාලවකවානුව ගැන සිතා බැලීම වැදගත්ය. පැරිස් කොමියුනයත්, 1905 විප්ලවයත් අතර පැවති වෙනස වසර 34ක් පමනි. 1975 සයිගොන්හි වැටීමේ සිට අද දක්වා ඇති කාලය තරම්, කොමියුනයේ ව්‍යසනය 1905 ලෙනින්ගේ පරම්පරාවට දුරස්ත වූයේ නැත.!

ප්‍රජාතන්ත්‍රවාදී ආඥාදායකත්වය පිලිබඳ ලෙනින්ගේ සූත්‍රගතකිරීමෙහි චිරකාලීන වැදගත්කමක් දරන තවත් පැත්තක් ද තිබේ. විප්ලවකාරී ගොවි ව්‍යාපාරයේ පරස්පර විරෝධී ස්වභාවය, සියල්ලටත් වඩා, ගොවි නැගිටීම හා ජනතාව ඉඩම් අත්පත්කර ගැනීම, ධනේශ්වර සම්බන්ධතා විනාශ කිරීම කරා අනිවාර්යයෙන්ම මෙහෙයවෙන්නේ නැත යන, ඔහුගේ අවධාරනය ප්‍රත්‍යක්ෂ හා විචක්ෂනය. වාමාංශිකයින් අතර නැවත නැවතත් දේශපාලන ව්‍යාකූලත්වයට තුඩුදී තිබූ කාරනයක් (නිදසුන් වශයෙන්, කැස්ට්‍රෝ, මාවෝ, නැක්සලයිට්වරු හා මෙක්සිකෝවේ "නියෝජ්‍ය අනදෙන්නා" වූ මාකෝස් පවා අගය කරන්නන් අතර) සමඟ පොර බදමින් ලෙනින් ගොවි රැඩිකල්වාදය සමාජවාදීය -එය ගම්බද දුගීන් අතර ඉඩම් බෙදාහැරීම සඳහා සටන් වදිද්දී පවා- යන පුලුල්ව පතිර පැවති සාවද්‍ය සංකල්පයට එරෙහිව තර්ක කලේය. ඉඩම් ජනසතු කිරීම ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවයේ ප්‍රධාන සංරචකයක් හා ඇතැම් තත්වයන් යටතේ, ධනවාදයේ වර්ධනයට තීරනාත්මක වන්නේ යයි ලෙනින් අවධාරනය කලේය. ඉඩම් ජනසතු කිරීමේ කර්තව්‍යය සමාජවාදී නොව, ප්‍රජාතන්ත්‍රවාදී යයි පැහැදිලි කරමින් ලෙනින් මෙසේ ලිවීය.

මෙම සත්‍යය වටහා ගැනීමට අසමත්



***වින්ටර් මාලිගය 1905 විප්ලවය***

> වීමෙන් සමාජවාදී විප්ලවවාදීහු, සුලු ධනේශ්වරයේ නොදැනුවත් දෘෂ්ටිවාදීන් බවට පත්වෙති. මෙම සත්‍යය අවබෝධකර ගැනීම, න්‍යායික පමනක් නොව ප්‍රායෝගික දේශපාලන ආස්ථානයකින් ද, සමාජ ප්‍රජාතන්ත්‍රවාදය සඳහා ඉමහත් වැදගත් කමක් දරයි. එතැන් සිට එය "පොදු ප්‍රජාතන්ත්‍රවාදී" ව්‍යාපාරය තුල කම්කරු පන්ති පක්ෂයේ පූර්න පන්ති ස්වාධීනත්වය සඳහා සටන් වැදීම අතනොහැරිය හැකි තත්වයකි. (29)

ජපානය සමඟ පැවති යුද්ධයේදී රුසියාවට අත්වූ මිලිටරි ව්‍යසනයන්, 1905 ජනවාරි 09 දින වින්ටර් මාලිගය දෙසට විරෝධතා පෙලපාලියකින් ගමන්ගත් සෙන්ට් පීටර්ස්බර්ග් කම්කරුවන් ඝාතනය කිරීම මඟින් කුලුගන්වන ලදුව, විප්ලවය පුපුරායාමට තුඩුදුන්නේය. රුසියානු අධිරාජ්‍ය තුල ඇතිවූ සමාජ පිපිරීම්, විප්ලවවාදී න්‍යායේ වර්ධනයට ඉමහත් ආවේශයක් සැපයීය. නොනවතින විප්ලවයේ න්‍යාය සූත්‍රගත කිරීමේදී ප්‍රමුඛ ක්‍රියාකලාපයක් ඉටුකල පුද්ගලයින් දෙදෙනා ට්‍රොට්ස්කි හා පාවුස් ය.

ජර්මනියේදී මියගොස් වසර 85 කට පසුව පවා පාවුස්, (1867-1924) ගුප්ත හා එක්තරා ආකාරයකට අභිරහස් පුද්ගලයෙකු ලෙස සිටියි. 19 වන සියවසේ අවසන් වසරවල හා 20 සියවසේ මුල් වසරවල මාක්ස්වාදී න්‍යායාචාර්යවරයෙකු ලෙස ඔහුගෙන් සිදුවූ

සැලකිය යුතු සේවයට වඩා බොහෝකොටම ඔහු සිහි ගන්වන්නේ, විප්ලවවාදී ව්‍යාපාරය හැර යාමෙන් පසුව, ප්‍රථම ලෝක සංග්‍රාම අවධියේ ඔහු යෙදීසිටි දූෂ්‍ය ව්‍යාපාරික කටයුතු වලින්ය. එහෙත්, මෙලොව එළිය දැකීමෙන් පසුව ඇලෙක්සැන්ඩර් හෙල්ෆන්ඩ් නම්වූ පාවුස්, රුසියාවේ හා ජර්මනියේ විප්ලවවාදී ජීවිතය තුල තීරනාත්මක භූමිකාවක් ඉටුකල බව අවිවාදිතය. ඔහු පලමුවෙන්ම යුරෝපීය සමාජවාදීන්ගේ අවධානය දිනාගත්තේ එඩුවාඩ් බර්න්ස්ටයින්ගේ සංශෝධනයන්ට එරෙහි ඔහුගේ ප්‍රහාරයන් සමග ය. කවුට්ස්කි කෙසේ වෙතත්, ලක්සම්බර්ග් පවා මෙම විවාදයට පිවිසීමට පෙර, 1898 ජනවාරියේදී, බර්න්ස්ටයින් විරෝධී ඔහුගේ පලමු ලිපි, ජර්මානු සමාජවාදී පුවත්පත්වල පලවිය. පාවුස්ගේ ලිපි වැදගත් කමක් අත්කර ගත්තේ හුදෙක් ඒවා කාලීන වීම නිසා පමනක් නොව, බර්න්ස්ටයින් වලිගය පාගාගෙන ඇතැයි යන හැඟීම දනවන, ජර්මානු හා ලෝක ධනවාදී ආර්ථිකය පිලිබඳව මනා අවබෝධයක් එම ලිපි වලින් විදහා දැක්වූ බැවිනි.

ට්‍රොට්ස්කි පසුව පිලිගත් පරිදි, රුසියානු විප්ලවයේ වර්ධනයෙහි ගතිකය පිලිබඳ ඔහුගේ අදහස් කෙරේ, පාවු ස් ගැඹුරින්ම බලපෑවේය. "කම්කරු පන්තිය විසින් බලය අල්ලා ගැනීම, තාරකා එල්ල කරගත් 'අවසන්' ඉලක්කයක සිට අපගේ කාලය සඳහාවූ ප්‍රායෝගික කර්තව්‍යය බවට නිශ්චිතවම පරිවර්තනය කලේ" පාවුස් බව ට්‍රොට්ස්කි ලිවීය. (30) 1905 ඔක්තෝබරයේදී සෙන්ට් පීටර්ස්බර්ග් සෝවියට් සභාව මතුවී ඒම, කම්කරු පන්තිය සඳහා දැවැන්ත ශක්‍යතාවන් විවර කල බව ට්‍රොට්ස්කි හා පාවුස් යන දෙදෙනාම වටහාගෙන සිටියහ. විප්ලවවාදී තත්වයක් තුල දිගහැරෙන පන්ති බලවේගයන්ගේ නොඅඩු වෛෂයික ගතිකය නොතකා හරින්නාවූ ජාතික නිෂ්පාදන බලවේගවල උපකල්පනික "වෛෂයික" වර්ධනය පිලිබඳ වියුක්ත ගනන් බැලීම් වලට සීමාවන විප්ලවයේ නියමාකාර ''කර්තව්‍යයන්'' පිලිබඳ සංකල්ප කිසිසේත්ම නොසෑහෙන්නේ යයි පාවුස් තර්ක කලේය. කම්කරු පන්තිය විසින් බලය අල්ලා ගැනීම වත්මන්හි සිදුවිය හැක්කක් බවට පත්ව තිබේ යයි පාවුස් තර්ක කලේය. පවත්නා ආර්ථික සම්පත් පිලිබඳ දෛවවාදී ගනන් බැලීමක් මත පදනම්ව, කම්කරු පන්තිය අවශ්‍යයෙන්ම කල යුත්තේ ධනේශ්වරය බලය සියතට ගන්නා ආකාරය පසෙකටවී ගෞරවයෙන් යුක්තව බලාසිටීම බව පැවසූ මෙන්ෂෙවික් තර්කය ඔහු ප්‍රතික්ෂේප කලේය. දේශපාලනයේ හා ආර්ථික විද්‍යාවේ අන්තර් ක්‍රියාකාරිත්වය පිලිබඳව කල මාහැඟි විවරනයක් තුල පාවුස්, නිර්ධන පන්තික විප්ලවවාදී මූලෝපායේ වඩාත් ආක්‍රමනකාරී සූත්‍රගත කිරීමක් සඳහා මග හෙලි කලේය.

> සිදුවීම්වල ඓතිහාසික ගමන් මඟේදී, සරල හා ඍජු ආකාරයකට පන්ති සම්බන්ධතා නීර්නය කෙරේ නම්, අප අපගේ මොල වලට පීඩාදිය යුතු නැත. අප කල යුත්තේ දෛවඥයන් ග්‍රහ වස්තුවක චලනය පිහිටුවන ආකාරයට, සමාජ විප්ලවය සඳහා හෝරාව ගනනය කිරීමයි. ඒ අනුව අපට හාන්සිවී එය නිරීක්ෂනය කල හැකිය. යථාර්තයේදී, පන්ති අතර සම්බන්ධතා, අන් සියල්ලටත් ඉහලින් දේශපාලන අරගලය පිහිටුවයි. තවද, අරගලයේ අවසන් ප්‍රතිපලය, පන්ති බලවේගයන්ගේ වර්ධනය මඟින් තීරනය කරයි. සියවස් ගනන් වෙලාගන්නා සමස්ත ඓතිහාසික ක්‍රියාවලිය, ද්විතීයික ආර්ථික, දේශපාලන හා ජාතික සංස්කෘතික තත්වයන් මත රඳ පවතියි. එහෙත් සියල්ලටත් වඩා එය රඳ පවත්නේ, අරගලයේ යෙදී සිටින සටන්කරුවන්ගේ විප්ලවවාදී ශක්තිය හා දේශපාලන සවිඥානකත්වය මත එනම්, දේශපාලන මොහොත අල්ලා ගැනීමේදී ඔවුන්ගේ ක්‍රමෝපායන් හා දක්ෂතා මතය. (31)

සමාජවාදය පිහිටුවීමට රුසියාව පරිනත වී ඇතැයි කියා නොසිටි පාවුස්, "බටහිර යුරෝපයේ සමාජ විප්ලවයෙන් තොරව දැනට රුසියාවට සමාජවාදය සැබෑවක් බවට පත්කර ගැනීමට නොහැකි යයි" එකහෙලා පැවසීය. (32) එහෙත්, පන්ති අරගලයේ ජවය, කම්කරු පන්තියට බලය ගැනීමේ හැකියාව ගෙන දෙන බව ඔහු විශ්වාස කලේය. ඉන්පසුව, කම්කරු පන්තියේ අවශ්‍යතා හැකිතාක් දුරට පෙරට ගෙනයාම පිනිස එම බලය යොදාගන්නවා ඇත.

විප්ලවවාදී වර්ධනයේ නිශ්චිත ගමන් මඟ පිලිබඳව අනාවැකි පලකිරීමට පාවුස් උත්සාහ නොකලේය. ඔහුගේ අදහසට අනුව දේශපාලනය, බලයන්ගේ සංකීර්න අන්තර් ක්‍රියාකාරිත්වයකට ද, වර්ධනයේ අප්‍රමාන විචල්‍යයන්ට ඉඩ සලසන බලපෑම් හා සාධකයන්ට ද සම්බන්ධය. අරගලයේ දිග්ගැස්සුනු ක්‍රියාදාමයන් පෙර දුටු ඔහු එහිදී, සාර්වාදී ආඥාදායකත්වය සැබවින්ම පෙරලා දැමීම නියෝජනය කරන්නේ, විප්ලවයේ ආරම්භක ලක්ෂය පමනක් යයි තර්ක කලේය.

> කම්කරු පන්තිය සමස්ත ජනතාවගේ ද සමස්ත සමාජයේ ද විප්ලවවාදී ව්‍යාපාරයේ හරි මැද හා මුදුනෙහි පිහිටුවාලමින් සමාජ ප්‍රජාතන්ත්‍රවාදය ඒ සමඟම, ආඥාදායකත්වය පෙරලා දැමීම පසු පසින් පැමිනෙන සිවිල් යුද්ධය සඳහා එය (කම්කරු පන්තිය) සූදානම් කල යුතුය. කෘෂිකාර්මික හා ධනේශ්වර ලිබරල්වාදය විසින් පහරදෙනු ලබූ හා දේශපාලන රැඩිකලුන් ද ප්‍රජාතන්ත්‍රවාදීන් ද විසින් පාවාදෙනු ලැබූ තතු හමුවේ එය සිදුවිය යුතුමය.
>
> ආඥාදායකත්වයේ බිඳවැටීම හා විප්ලවය, එකම දේ නොවන බව කම්කරු පන්තිය විසින්

> වටහාගත යුතුව ඇත. දේශපාලන විප්ලවය ඉදිරියට ගෙනයාමේදී පලමුව ආඥාදායකත්වයටත් දෙවනුව ධනේශ්වරයටත් එරෙහිව කරන අරගලය අත්‍යවශ්‍යය. (33)

"ජනවාරි 09 දින සිදුවූයේ කුමක් ද?" යන පාවුස්ගේ සැලකිය යුතු රචනාවෙහි දේශපාලන අභිනිවේෂනයන් සම්භාරයක් ගැබ්ව තිබේ. අවම වශයෙන් පන්ති අරගලයේ යථාර්තය හඳුනා ගැනීමේදී, අපගේ කාලයට වඩා සාපේක්ෂව ඉහල මට්ටමක පැවති දේශපාලන අවධියක් පිලිබිඹු කෙරෙන ප්‍රඥාව එහි අන්තර්ගතය. තාවකාලික හා වැනෙන සුලු සගයන් සමඟ එක පෙලට පිහිටා සටන් කිරීමේදී මතුවන ගැටලු සාකච්ඡා කරන පාවුස්, මෙසේ උපදෙස් දුන්නේය.

> (1) සංවිධානාත්මක රේඛා බොඳ කර නොගන්න. වෙන්ව ගමන් කරනු, එක්ව පහර දෙනු.
>
> (2) අපගේම දේශපාලන ඉල්ලීම් වලදී වැනෙන්ට එපා.
>
> (3) පන්ති ආසක්තයන්ගේ වෙනස්කම් නොසඟවනු.
>
> (4) අපගේ සතුරන් ගැන සෝදිසියෙන් සිටින අයුරින්ම අපගේ මිතුරන් ගැන ද විමසිලිමත් වනු.
>
> (5) සන්ධානය පවත්වාගැනීමට වඩා අරගලය මඟින් නිර්මිත තත්වයේ වාසිය දිනා ගැනීම කෙරෙහි අවධානය යොමු කරනු. (34)

1905 අවසාන කාලයේ ට්‍රොට්ස්කි, "ජනවාරි 09 වනදා තෙක්" යන ලිපිය තුල මෙසේ සඳහන් කලේය. පලමු වරට ඩේ හා ගයිඩෝගේ මෙම සංග්‍රහය තුල එම ලිපියේ සම්පූර්න ඉංග්‍රීසි පරිවර්තනය අඩංගු වෙයි. එය, රුසියානු ධනේශ්වරයේ ලිබරල් නියෝජිතයන්ගේ දේශපාලන කුනුවීම පිලිබඳ තියුනු හා අර්ථභාරී හෙලිදරව්වක් විය. ජපානය සමඟ යුද්ධයේදී රුසියානු හමුදා ලත් ව්‍යසනකාරී පරාජයන් මගින් නිර්මිත, ඔඩු දුවන අර්බුදයේ අවධියක් තුල, සාර් පාලනය කෙරෙහි ඔවුන් දැක්වූ කොන්ද පන නැති හා නිහීන ආකල්පය ට්‍රොට්ස්කි මෙහිදී ඉදිරිපත් කරයි. ලිබරල් දේශපාලඥයන් යුද්ධයේදී එකට අත්වැල් බැඳගත් ආකාරය පිලිබඳව ඔහු ලිව්වේ පිලිකුලෙන් යුතුවය.

> නිර්ලජ්ජිත මනුෂ්‍ය ඝාතනයේ කුනු කසල ඇදීමට හවුල්වීමෙන් පමනක් ලිබරලුන් සෑහීමට පත්වූයේ නොවේ. එහි වියදමෙන් කොටසක් ජනතාව මත පැටවීමට ද ඔවුහු හවුල් වූහ. ඔවුන්, සාර්වාදී ක්‍රියාපිලිවෙත කෙරෙහි සිය නිහඬ දේශපාලන අනුමැතිය හා එකඟත්වය පලකිරීමෙන් සෑහීමකට පත් නොවූවාක් මෙන්ම, ඉමහත් අපරාධයන්ට වගකිවයුතු අය සමඟ ඔවුන්ගේ සදාචාරවාදී සහයෝගිතාව පිලිබඳව සෑම දෙනාටම ප්‍රසිද්ධියේ කියා සිටියේ ද නැත. පුරසාරම් සහගත විධිමත් සම්මන්ත්‍රන එකකට පසු එකක් වශයෙන් යොදාගනිමින් ඔවුන් ඊට ප්‍රතිචාර දැක්වූයේ, යුද ප්‍රකාශ කිරීම පිලිබඳව බැතිබර ප්‍රකාශ නිකුත් කරමින් හා සිය දේශපාලන මුග්ධත්වය පල කරමින් ය.
>
> කාලකන්නි, කෙඳිරිගාන, ගොරවන, බේගල් දෙසා බාන, බයෙන් තැතිගැන්වුන, කෙලෙසුන හා දූෂිත නිදහස් මාධ්‍ය සම්බන්ධයෙන් කියනුම කවරේ ද? (35)

තරුන ට්‍රොට්ස්කි මේ විස්තර කරන්නේ එක්සත් ජනපදයේ ඩිමොක්‍රටික් පක්ෂය හා අද දිනයේ *නිව් යෝර්ක් ටයිම්ස්* පත්‍රය යයි යමෙක් විශ්වාස කලහොත් ඊට සමාව දිය හැකිය. එහෙත් සමාජවාදීන් ධනේශ්වර ලිබරල්වාදයේ දූෂිත භාවය මනාව වටහා ගත්තේ සියවසකටත් වඩා ඉහතදීය.

අනෙකුත් විශිෂ්ඨ ලේඛකයන්ගේ කෘතීන් ඇතුලත් සංග්‍රහයක් තුල පවා ට්‍රොට්ස්කිගේ ආරම්භක රචනාවන්හි නව ඉදිරිදර්ශනය, අපූර්ව හා ප්‍රබල හඬකින් ප්‍රකාශිත වන්නේය. මෙම ආරම්භක ලේඛන තුල පවත්නා වඩාත්ම වැදගත් දේ නම්, කම්කරු පන්තියේ ජනතා විප්ලවවාදී ව්‍යාපාරයක මතුවීම හා බලය සඳහා අරගලයේදී එහි භෞතික බලය පිලිබඳව, ඒවා තුල අන්තර්ගත වන විචිත්‍ර සංකල්පනයන් හා පැහැදිලි ප්‍රකාශයන්ය. මේ අර්ථයෙන් කවුට්ස්කිගේ ලේඛන හා මේවායේ ඇති වෙනස කැපී පෙනෙයි. විප්ලවවාදී ඉදිරිදර්ශනයක් සූත්‍රගතකිරීමේදී හා ආරක්ෂා කිරීමේදී කවුට්ස්කිගේ හොඳම නිර්මාන තුල පවා, ප්‍රතිවිරුද්ධ පන්ති බලවේගයන්ගේ ගැටුම පිලිබඳ ඔහුගේ නිරූපනය වියුක්ත මෙන්ම ලේඛකයා තුල ඇති සැක සාංකා පිලිබිඹු කරන බව දක්නට ලැබේ. ප්‍රචන්ඩ බලය යෙදීමකින් තොරව කම්කරු පන්තියට, සිය පන්ති සතුරා ඔහුගේ බලය අතහැර දමන සේ බියගැන්විය හැකිය යන අදහස ඔහු විවෘතව තබන්නේ එතරම් ඒත්තු ගැන්වෙන ආකාරයකින් නොවේ! ඔහු මෙසේ ලිවීයඃ

> නැඟී එන පන්තියකට, පැරනි පාලක පන්තිය පෙරලා දැමීමට අවශ්‍ය නම්, බලය යෙදීමේ උපකරන එය සතුව තිබිය යුතු නමුත්, ඒවා *පාවිච්චියට ගැනීම* කොන්දේසි විරහිත අවශ්‍යතාවක් නොවේ. නිශ්චිත තත්වයන් යටතේ, පිරිහී යන පන්තිය එවන් උපකරන පවතින බව දැනසිටීම, ඉහවහා ගිය බලයක් සහිත සතුරා සමඟ සාමකාමී එකඟත්වයකට පැමිනීම සඳහා එම පිරිහී යන පන්තිය ඒත්තුගැන්වීමට ප්‍රමානවත් වනු ඇත. (36)

බලය සඳහා සන්නද්ධ අරගලයකට උපදෙස් දීම කෙසේ වෙතත්, එය නොවැලැක්විය හැකි යයි ඇඟවුම් කෙරෙන පක්ෂය තුල වන කුමකට හෝ සතුරු කොටස් ඒස්පීඩීයේ, විශේෂයෙන්ම වෘත්තීය සමිති තුල සිටින බව කවුට්ස්කි මනාව දැනසිටියේය යන්න, සැබවින්ම සිත තබාගත යුතුය. එවන් අපරීක්ෂාකාරී සූත්‍රගතකිරීම්

න්‍යායික සඟරාවක පවා ඇතුලත්ව තිබීම, එස්පීඩී යට පහරදීමට නිමිත්තක් ලෙස පෘසියානු රජය විසින් ඩැහැගැනීමේ ඉඩකඩ ඔහු නොතකා හැරියේ ද නැත. සමාජ ප්‍රජාතන්ත්‍රවාදය සමඟ ලේ වැකි ගැටුමකට නිරතුරුව උඩගෙඩි දුන් රාජ්‍ය යන්ත්‍රය තුල බලපෑම් සහිත ඉහල අධිකාරීන් සිටියේය යන්න ද ප්‍රකට කාරනයකි. ඒ සියල්ල තිබියදී වුවත්, නූතන ධනේශ්වර රාජ්‍යයක් තුල කම්කරු පන්තිය මුහුන දෙන මඟ නොහැරිය හැකි ගැටලුවට පැහැදිලි උත්තරයක් කවුට්ස්කි ලඟ නොතිබුන බව නිසැකයඃ ආන්ඩුව යටතේ ඇති මිලිටරි බලයේ ප්‍රතිරෝධය ජයගත හැක්කේ කෙසේද? එක් රචනාවක් තුල කවුට්ස්කි, පරාජයට පත්වන ආන්ඩුවක්, මිලිටරිය බලමුලු ගැන්වීමෙන් තම ආරක්ෂාව සලසා ගැනීමට සූදානම් වීම නොවිය හැක්කක් බව කියන තරම් දුර ගමන් කලේය. "අවශ්‍ය නිර්ධය භාවයෙන් යුක්ත ඕනෑම ආන්ඩුවකට, තාක්ෂනික මිලිටරි ආධිපත්‍යය පිලිබඳ වැටහීම, මහජන සන්නද්ධ නැගිටීමක් දෙස නිසොල්මනේ බලා සිටීමේ හැකියාව උදාකරයි." (37)

ඩේ හා ගයිඩෝට අනුව, ට්‍රොට්ස්කි මෙසේ පෙන්වා දුන්නේය. "සිදුවන්නේ හරියටම තර්කයේ ප්‍රතිවිරුද්ධයයිඃ මහා වැඩවර්ජනයක් තුලදී නොවැලැක්විය හැකි ලෙසම, වැඩවර්ජකයින්ට වෙඩි තැබීමට නියෝග කරමින් ආන්ඩුව ප්‍රතිචාර දැක්වීමත් සමඟ තත්වය තුඩු දෙන්නේ සන්නද්ධ ගැටුමකටය." (38) කවුට්ස්කිට අනුව, කම්කරුවන්ට වෙඩි තැබීම සඳහා සොල්දාදුවන්ට නියෝග දීමේ එකම අර්ථය, විප්ලවය අවසානයි යන්නය. ට්‍රොට්ස්කිට අනුව, එවන් නියෝග තුඩුදිය හැක්කේ පීඩාකාරී රාජ්‍යයේ අවසානයට ය. විප්ලවය පරාජය කිරීමට අවශ්‍ය වන්නේ, සැලකිය යුතු තරමින් ප්‍රචන්ඩත්වය යොදාගැනීම පමනක් බව ප්‍රතිගාමීන් විශ්වාස කල බව ට්‍රොට්ස්කි සඳහන් කලේය. ට්‍රොට්ස්කි "මහා ආදිපාද ව්ලැඩිමීර්" සමීපව නිරීක්ෂනය කලේය.

> ව්ලැඩිමීර් පැරිසියේ ගතකල කාලය තුල වෛශ්‍යා මඩම් පමනක් නොව, මහා විප්ලවයේ මිලිටරි පරිපාලනයෙහි ඉතිහාසය ද අධ්‍යයනය කලේය. ලුවී රජුගේ ආන්ඩුව, විප්ලවයේ සෑම දලුවක්ම දෙගිඩියාවකින් හෝ පැකිලීමකින් තොරව තලා දමා, නිර්ධය හා පුලුල් ලෙස ලේ හැලීමක් සංවිධානය කරමින් ජනතාවට බෙහෙත දුන්නේ නම්, පැරනි පර්යාය රැකගත හැකිව තිබූ බව ඔහුගේ නිගමනය විය. ජනවාරි 09දා අපගේ බොහෝ ආනුභාව සම්පන්න බේබද්දා හෙවත් ව්ලැඩිමීර්, මෙය හරියටම කල හැකිව තිබුනේ කෙසේ ද යන්න පෙන්වා දුන්නේය...... තුවක්කු, රයිෆල් හා මූනිස්සම්, පවත්නා පර්යායේ විශිෂ්ඨ සේවකයන් වන්නේය. එහෙත් ඒවා වැඩට බැස්සවිය යුතුය. ඒ කාර්යය සඳහා මිනිසුන් අවශ්‍යය. මේ මිනිසුන් සොල්දාදුවන් ලෙස හැඳින් වුව ද ඔවුහු තුවක්කු වලින් වෙනස් වෙති. මක්නිසා ද යත්, ඔවුන් සිතන හා ඔවුන්ට දැනෙන නිසාය. එහි තේරුම ඔවුන් විශ්වාස කටයුතු නොවන බවයි. ඔවුන් වැනෙන සුලුය, සිය ආඥාපතීන්ගේ අතීරනය ඔවුන් තුලට ඔඩු දුවනු ඇත. එහි ප්‍රතිපලය වන්නේ, හමුදා නිලධරයේ ඉහල තට්ටු තුල හටගන්නා අපිලිවෙල හා බියපත් වීමයි. (39)

නොනවතින විප්ලවයේ න්‍යාය තව දුරටත් නිශ්චිත ලෙස විස්තාරනය කරමින් 1906 දී ප්‍රකාශයට පත් කල *ප්‍රතිපල හා ඉදිරිදර්ශනයෝ* *(Results & prospects)* යන ට්‍රොට්ස්කිගේ පලමු ලේඛනය, මේ එකතුවට ඇතුලත් කර නැත. එහෙත්, රුසියානු ලිබරල්වාදයේ ප්‍රතිගාමී කැරැට්ටුව පිලිබඳ අවඥාසහගත හෙලිදරව්කිරීම්වල සිට, පන්ති අරගලයේ තර්කනය, කම්කරු පන්තියට බලය ගැනීමට බල කරන්නේය යන ඔහුගේ නිගමනය දක්වා දිව යන ට්‍රොට්ස්කිගේ දේශපාලන චින්තනය ග්‍රහනය කර ගත හැකි බෙහෙවින් වැදගත් ලේඛන ගනනාවක්ම ඩේ හා ගයිඩෝ විසින් මෙහිදී සම්පාදනය කර තිබේ. කල්තියා සූදානම් කල මෙම තීරනාත්මක කෘතීන් අතර ට්‍රොට්ස්කිගේ, *"Introduction to Ferdinend Lassalle's Speech to the jury"*(ජූරියට කල ෆර්ඩිනන්ඩ් ලසාල්ගේ කථාවේ හැඳින්වීම), *(Social Democracy and Revolution)* *"සමාජ ප්‍රජාතන්ත්‍රවාදය හා විප්ලවය"* හා *Foreward to Karl Marx, "Parizhskaya Kommuna"* (කාල් මාක්ස්ට පිලිගැන්වීම, *පැරිස් කොමියුනය*) ද වෙයි. මේ සියලු රචනා, ට්‍රොට්ස්කි සෙන්ට් පීටර්ස්බර්ග් සෝවියට් සභාවේ සභාපති ලෙස පත්වූ හා ප්‍රථම රුසියානු විප්ලවයේ ශ්‍රේෂ්ඨ කථකයා හා මහජන නායකයා ලෙස මතුව ආ 1905 වසරේ පටන් ඉදිරියට දිව යයි.

ට්‍රොට්ස්කිගේ *"ජූරියට කල ෆර්ඩිනන්ඩ් ලසාල්ගේ කථාවේ හැඳින්වීම"* නම් කෘතිය ඔහුගේ ශ්‍රේෂ්ඨ රචනා අතරින් එකකි. ප්‍රජාතන්ත්‍රවාදී බලවේගයන්ගේ උග්‍ර වාමාංශික කන්ඩායමේ නියෝජිතයෙක් වශයෙන් ලසාල්, 1848 ජර්මානු විප්ලවය තුල ප්‍රමුඛ ක්‍රියාකලාපයක් ඉටුකලේය. පෘසියාවට එරෙහිව මහජන නැගිටීමක් අවිස්සීම මත අත් අඩංගුවට ගත් ලසාල්, නිදහසට කරුනු ඇතුලත් තමන්ගේම දේශනය ලිවීය. දේශනය කිසිවිටකත් අධිකරන ශාලාව තුල සැබවින්ම බෙදා නොහැරිය නමුත්, පිටපත් දහස් ගනනින් ජර්මනිය පුරා බෙදාහරිනලද එම ලිඛිත කෙටුම්පත ඉමහත් බලපෑමක් ඇති කලේය. ඩේ හා ගයිඩෝ නිරීක්ෂනය කල පරිදි ට්‍රොට්ස්කි, *"ජූරියට කල ලසාල්ගේ කථාව තුල අඩංගු ඉමහත් ආවේගය පැහැදිලිවම අගය කලේය."* 1905 විප්ලවය පරාජය වීමෙන් පසුව, 1907 දී ඔහුට විරුද්ධව පැවති නඩු විභාගයේදී ට්‍රොට්ස්කි විසින් පැවැත්වූ ඊට නොදෙවෙනි ලෙස අනුස්මරනීයවූ

දේශනයේ ආකෘතිය කෙරෙහි එය නිසැකවම බලපෑවේය. (40)

සිය "හැඳින්වීම" තුල ට්‍රොට්ස්කි, සාර්වාදී ආශ්‍රාදායකත්වයට එරෙහි සමකාලීන අරගලයේදී, කම්කරු පන්තියට හමුවන නරකම සතුරා රුසියානු ධනපති පන්තියය යන වැදගත් දේශපාලන නිගමනය උපුටා ගැනීමට, 1848 විප්ලවයෙන් පාඩම් උකහා ගත්තේය. විප්ලවය, තමන්ගේම අවශ්‍යතා සාක්ෂාත්කර ගැනීම සඳහා කෙතරම් තීරනාත්මක වුවත්, එසේ කිරීමේදී ජනනය කල හැකි අනපේක්ෂිත ප්‍රතිවිපාක පිලිබඳ අන්තරාය, 1789-95 සිදුවීම් තුලින් ධනපතීහු ඒත්තු ගෙන සිටියෝය. සිය සමාජ හා ආර්ථික තත්වය තහවුරු කර ගැනීමේදී ලත් සාර්ථකත්වය, ජනතාවගේ අවශ්‍යතාවන්ට විරුද්ධ වීමේ ඔවුන්ගේ අධිෂ්ඨානය එන්ට එන්ටම දැඩි කලේය. එලඹෙන ගැටුමේදී, සමාජය ගැන ඉන් පෙර සඟවාගෙන තිබූ යථාර්තය එලිමහනට පැමිනියේය. සිහියට නැඟෙන ඡේදයක් තුල ට්‍රොට්ස්කි, විප්ලවවාදී අවධියක් යනු "දේශපාලන භෞතිකවාදයේ පාසැලක්" ලෙස විස්තර කලේය.

> එය, සියලු සමාජ ප්‍රතිමානයන් බලය පිලිබඳ හඬ බවට පත්කලේය. බලය මත විශ්වාසය තබන, එක්සත්වූ, විනයගත හා ක්‍රියාවට බැසීමට සූදානම් අයට එයින් තල්ලුවක් ලැබුනි. එහි දැවැන්ත කම්පනයන් විසින් ජනතාව අරගලයේ ක්ෂේත්‍රයට තල්ලු කරනු ලැබූ අතර, ඉවත්ව යන හා අලුතෙන් පැමිනෙන පාලක පන්තීන් දෙගොල්ලම ඔවුන් හමුවේ නිරාවරනය කරනු ලැබිනි. හරියටම මේ කාරනය නිසා, බලයෙන් පහවන අයත් අලුතෙන් බලය අත්පත් කර ගන්නා අයත් යන පන්ති දෙකටම එය බිය ජනක විය. ඔවුන් මේ මඟට පිවිසුන කල, ජනතාව තමන්ගේම තර්කනය වර්ධනය කර ගනිමින්, අලුතෙන් පැමිනි ධනේශ්වරයේ දෘෂ්ටි ආස්ථානයෙන් ගත් කල ඕනෑවට වඩා දුර ගමන් කරයි. සෑම දිනකම නව සටන් පාඨ ඉදිරියට එයි. ඒ හැම එකක්ම කලින් තිබුන සටන් පාඨයට වඩා පෙරලිකාරී විය. ඒවා, මනුෂ්‍ය ශරීරයේ ලේ ගමනය මෙන් සීග්‍රයෙන් පැතිර ගියේය. ධනේශ්වරය, නව පද්ධතියක ආරම්භක ලක්ෂය ලෙස විප්ලවය පිලිගත්තේ නම් එය, ජනතාව විප්ලවවාදී ලෙස පැහැර ගන්නා සියල්ලට විරුද්ධව නීතිය හා සාමය වෙනුවෙන් ආයාචනය කිරීමේ අවස්ථාව ඔවුන්ට අහිමි කරයි. මහජනයාගේ අයිතීන්හි වියදමෙන් ප්‍රතිගාමිත්වය සමඟ සම්මුතියක් ගසා ගැනීම ලිබරල් ධනපතියන්ට පන්ති අවශ්‍යතාවක් බවට පත්වන්නේ එබැවින්ය. විප්ලවයට පෙරත් විප්ලවයේදීත් ඉන් පසුවත් එහි ආස්ථානය එක හා සමාන අයුරෙන් යෙදෙයි. (41)

ජර්මානු ධනේශ්වරය, 1848 ප්‍රජාතන්ත්‍රවාදී විප්ලවය පාවාදුන් ආකාරය සමීපව විමසා බැලීමෙන් පසුව ට්‍රොට්ස්කි, අත්‍යවශ්‍ය දේශපාලන නිගමනය උපුටා ගත්තේය: ධනේශ්වරය, කුමන හෝ ප්‍රගතිශීලී දේශපාලන ක්‍රියාකලාපයක් ඉටුකරනු ඇතැයි යන්න ගැන එතැන් සිට අඩ සියවසකට පසුව පැවතුනේ ඊටත් අඩු ඉඩ කඩකි. තව ද, පූර්ව අඩ සියවසක කාලය තුල ධනවාදයේ ගෝලීය වර්ධනය විසින්, දේශපාලන ආධිපත්‍යයේ හා ආර්ථික සූරාකෑමේ ලෝක පරිමාන පද්ධතියක් තුලට රුසියානු ධනේශ්වරය ඇදගනු ලැබ තිබුනි. රුසියානු විප්ලවයේ වර්ධනය තුල නව හා තීරනාත්මක සාධකය කෙරෙහි අවධානය යොමුකල යුතු යයි ට්‍රොට්ස්කි කියා සිටියේ මෙම තත්වය පිලිබඳවය.

> සියලු රටවල් මත ආර්ථිකය පිලිබඳ තමන්ගේම ක්‍රමය හා තමන්ගේම සම්බන්ධතා පිහිටුවමින් ධනවාදය, සමස්ත ලෝකයම එක් ආර්ථික හා දේශපාලන යාන්ත්‍රනයක් බවට පරිවර්තනය කර තබුනි. නූතන නය පද්ධතිය, අදෘෂ්‍යමාන හුයකින් දහස් ගනන් ව්‍යවසායන් එකට බැඳ දමන්නාක් මෙන් ද, විවිධාකාර කුඩා හා පාර්ශවීය අර්බුද අතුගා දමමින් හා ඒ සමඟම, පොදු ආර්ථික අර්බුද අනුපමේය ලෙස වඩාත් බැරෑරුම් කරමින් ප්‍රාග්ධනය සඳහා විශ්මයජනක සංචලනයක් ලබා දෙන, සියලුම ප්‍රතිගාමී බලවේග ලෝක පරිමාන එක් ඒකාබද්ධ ව්‍යාපාර වස්තු සමාගමක් බවට පත්කරන සිය ලෝක වෙලඳම හා සිය දැවැන්ත රාජ්‍ය නය හා ජාත්‍යන්තර දේශපාලන සන්ධාන, සියලු පාර්ශවීය දේශපාලන අර්බුද වලට ප්‍රතිරෝධය දක්වනවා පමනක් නොව, පෙර නොවූ විරූ පරිමානයේ සමාජ අර්බුදයක් සඳහා කොන්දේසි ද සකසයි. සකල රෝග සන්තතීන් ජාත්‍යන්තරීකරනය කරමින් ද, සියලු දුෂ්කරතා නොවිසඳ යටපත් කරමින් ද, ජාතික හා ජාත්‍යන්තර දේශපාලනයේ සියලු ප්‍රගාඪ ප්‍රශ්න පසෙකට පිස දමමින් ද සියලු ප්‍රතිවිරෝධතා වසං කරමින් ද ධනපතීන් විසින් ඉටුකරගෙන ඇත්තේ මහා පිරිහීම කල්දමා ගැනීම පමනකි. ඒ සමඟම, පෙරලිකාරිත්වයක් ද, සිය ආධිපත්‍යයේ ලෝක පරිමාන දියකර හැරීමක් ද සූදානම් කර ගැනීම පමනකි. එය, සෑම ප්‍රතිගාමී බලයක්ම කැදර ලෙස වැලඳ ගන්නේ ඒවායේ උල්පත ගැන කිසිදු ප්‍රශ්නකිරීමකින් තොරවය...
>
> මෙම කාරනය එහි මූලාරම්භයේ සිටම,

> දැන් දිගහැරෙමින් තිබෙන සිදුවීම්වල ජාත්‍යන්තර ස්වභාවය හා කම්කරු පන්තිය ඉදිරියේ විවෘත කෙරෙන ප්‍රතාපවත් බලාපොරොත්තු ගෙනහැර දැක්වීය. රුසියානු කම්කරු පන්තිය මුලපිරූ දේශපාලන විමුක්තිය, එය ඓතිහාසිකව පෙර නොවූ විරූ මුදුනකට ඔසවමින්, එයට ඉමහත් මාධ්‍යයන් හා සම්පත් ලබා දෙමින්, ලෝක පරිමානව ධනවාදය පෙරලා දැමීමේ නායකයා බවට එය පත්කරන අතර, ඉතිහාසය ඒ සඳහා සියලු වෛෂයික පූර්ව කොන්දේසි සූදානම්කර තිබේ. (42)

මෙම ඡේද, ලෝක සමාජවාදී විප්ලවයේ මූලෝපායඥයා ලෙස ට්‍රොට්ස්කිගේ ඉස්මතුවීම සලකුනු කරයි!

1905 ඔක්තෝබරයේ එල්ලවූ සංකේතාත්මක ප්‍රහාරයේ බලපෑමට යටින් හා සෙන්ට් පීටර්ස්බර්ග් සෝවියට් සභාව නිර්මානය කිරීමෙන්, මාක්ස්වාදයේ සම්ප්‍රදායික අර්ථ කථනයට අනුව නම්, සමාජවාදී විප්ලවය සඳහා පරිනත නොවූ රුසියාවේ ආර්ථික පසුගාමිත්වය තුල දිග හැරෙන විප්ලවවාදී තත්වයේ තීරනාත්මක බලවේගය කම්කරු පන්තියයි යන ඉවත නොදැමිය හැකි යථාර්තය තුල අතිශයින්ම දිදුලන ප්‍රතිවිරෝධය විසඳනු ඇති දේශපාලන සූත්‍රය සොයාගැනීමට වැඩි දියුනු සමාජවාදී චින්තකයන් කැඳවූ අභියෝගයක් විය. විප්ලවය ගමන් කරන්නේ කුමන දිසාවකට ද? කම්කරු පන්තියට අත්කරගත හැකිවේ යයි බලාපෙරොත්තු වන්නේ කුමක් ද?

1905 වසරේ නොවැම්බරයේ දී මෙසේ ලියමින් පාවුස් උපදෙස් දුන්නේ,

> රුසියානු කම්කරු පන්තියේ ඍජු විප්ලවවාදී අරමුන වන්නේ, කම්කරුවන්ගේ ප්‍රජාතන්ත්‍රවාදී ඉල්ලීම් සාක්ෂාත් කෙරෙන වර්ගයේ රාජ්‍ය පද්ධතියක් අත්කර ගැනීමයි. කම්කරුවන්ගේ ප්‍රජාතන්ත්‍රවාදයට, ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදයේ වඩාත් ආන්තික ඉල්ලීම් සියල්ල අන්තර්ගත වන නමුත්, ඉන් සමහරකට විශේෂ ස්වභාවයක් ගෙනදෙන අතර තරයේම කම්කරු පන්තික වන නව ඉල්ලීම් ද ඇතුලත් වනු ඇත. (43) යනුවෙනි.

ඔහු පැහැදිලි කල පරිදි රුසියානු විප්ලවය, "සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ අවම ක්‍රියාමාර්ගය හා එහි අවසාන අරමුන අතර විශේෂ සම්බන්ධයක් නිර්මානය කරයි." ඉන් පසු පාවුස් මෙසේ ද පැවසීය.

> එවැන්නක කර්තව්‍යය, රටේ නිෂ්පාදන සම්බන්ධතාවන්හි මූලික වෙනසක් සිදු කිරීම වන බැවින් මෙය, කම්කරු පන්ති ආඥාදායකත්වය ඇඟවුම් නොකරන නමුත් එය දැනටමත් ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදය ඉක්මවා ගොස් තිබේ. රුසියාව තුල අප, තවමත් ධනේශ්වර විප්ලවය සමාජවාදී විප්ලවය බවට හැරවීමේ කාර්යය භාර ගැනීමට සූදානම් නැති අතර ධනේශ්වර විප්ලවයට යටත් වීමෙහිලා අපේ සූදානම ඊටත් වඩා අඩුය. අපගේ සමස්ත ක්‍රියාමාර්ගයේ පලමු පරිශ්‍රමය මෙයින් අර්බුදයට පත් කරනවා පමනක් නොවේ. කම්කරුවන්ගේ පන්ති අරගලය ද අප ද ඉදිරියට තල්ලු කරයි. *ධනේශ්වර ව්‍යවස්ථාව ඇතුලතින්ම*, සමාජ විප්ලවවාදී පෙරලිකාරිත්වය සඳහා හැකි ඉහලම අවස්ථා නිර්මානය කිරීමෙන් හා කම්කරු පන්තියේ අවශ්‍යතා ධනේශ්වර විප්ලවය තුලට අන්තර්ගත කිරීම මගින් එහි සීමා පුලුල් කිරීම අපගේ කර්තව්‍යය වේ. (44)

රුසියානු ආර්ථික වර්ධනයේ පසුගාමිත්වය හා කම්කරු පන්තියේ දේශපාලන ගතිකය විසින් මතුකල ගැටලු හමුවේ පාවුස් පවා පසු බැස්ස බවක් පෙනෙන්නට තිබුනි.

ඉන් මසකට පසුව, මාක්ස්ගේ පැරිස් කොමියුනය පිලිබඳ කතාවේ සිය පෙරවදන තුල ට්‍රොට්ස්කි, මෙම ගැටලුවට විසඳුමක් තිබෙන බව අවධාරනය කලේය. එහෙත් එය සොයා ගැනීමේදී, දී ඇති රටෙහි නිෂ්පාදන බලවේගවල වර්ධනයේ මට්ටමත්, බලය අල්ලා ගැනීමෙහි ලා කම්කරු පන්තිය සතු ධාරිතාවත් අතර විධිමත් හා යාන්ත්‍රික සම්බන්ධතාවක් නොමැති බව වටහා ගැනීම අවශ්‍ය කෙරේ. විප්ලවවාදී පක්ෂයේ ගනන් බැලීම් වලට වෙනත් තීරනාත්මක සාධක ද ඇතුලත් විය යුතුය. ඒවා නම්, "පන්ති අරගලයේ සම්බන්ධතා, ජාත්‍යන්තර තත්වය, හා අවසාන වශයෙන් සටන සඳහා සූදානම, ආරම්භකත්වය ගැනීම හා සම්ප්‍රදායන් ද ඇතුලත් ආත්මීය සාධක ගනනාවකි." (45) මෙම අභිනිවේෂයෙන් එලඹි නිගමන කවරේ ද? ට්‍රොට්ස්කි මෙසේ ප්‍රකාශ කලේය. "ආර්ථික වශයෙන් පසුගාමී රටක් තුල කම්කරු පන්තියට, අතිශයින් දියුනු ධනේශ්වර රටකදීට වඩා ඉක්මනින් බලයට පත්විය හැකිය." (46) මෙම නිගමනය කරා එලඹීම සඳහා අඩ සියවසක සමාජ-ආර්ථික වර්ධනය, දශක ගනනාවක න්‍යායික වැඩ කටයුතු හා විප්ලවයක අත්දැකීම්, අවශ්‍ය විය.

මේ වන විට ට්‍රොට්ස්කි සිය නොනවතින විප්ලවයේ මූලික සැකිල්ල සඳහා වැඩකර තිබුනි. සැබවින්ම ලසාල්ගේ කථාවට ඔහු ලිවූ "හැඳින්වීමේ" ඡේද හා පැරිස් කොමියුනය පිලබඳ මාක්ස්ගේ කථාවට ලිවූ "ප්‍රස්ථාවනාව" *ප්‍රතිපල හා ඉදිරිදර්ශනයෝ* කෘතිය තුල ප්‍රතිනිර්මානය කරනු ලැබීය. කෙසේ වෙතත්, මෙම තීරනාත්මක කෘතිය ලිවීමට සූදානම් වෙද්දී පවා, ට්‍රොට්ස්කිට කවුට්ස්කිගේ ලිපි වලින් දිගටම ධෛර්යයක් ලැබුනි.

ඩේ-ගයිඩෝ සංග්‍රහය තුල අන්තර්ගතවූ වඩාත්ම වැදගත් ලේඛන අතරට 1906 පෙබරවාරියේ කවුට්ස්කි

කල මුලුමනින්ම පාහේ අප්‍රකට කෘතියක් වූ "ඇමරිකානු කම්කරුවා" ද ඇතුලත් වෙයි. එක්සත් ජනපදය තුල *සමාජවාදය නොමැත්තේ කුමක් නිසා ද?* යන කුතුහලය දනවන ශීර්ෂ පාඨයක් සහිතව ජර්මානු සමාජ විද්‍යාඥයෙකු (1863-1941) වූ වර්නර් සොම්බාට් විසින් ඇමරිකානු සමාජය පිලිබඳව සිදු කල අධ්‍යයනයට පිලිතුරක් ලෙස මෙය ලියන ලදී. එය වැදගත් ප්‍රශ්නයක් විය. පැහැදිලිවම දේශපාලන දෘෂ්ටි ආස්ථානයෙන් ගත්කල එයට පිලිතුරු ලිවිය යුතුව තිබුනි. අතිශයින්ම දියුනු ධනේශ්වර රටේ කම්කරු පන්තිය තුලින් පුලුල් අනුගාමිකත්වයක් දිනාගත නොහැකිව ඇත්නම්, සමාජවාදයේ අනාගතය කුමක් වන්නේ ද? තව ද, නොසලකා නොහල හැකි තීරනාත්මක න්‍යායික ප්‍රශ්නයක් ද විය. මාක්ස්වාදී න්‍යායේ ආකෘතිය තුල පහත සඳහන් පරස්වාචකය යමෙක් පැහැදිලි කරනු ඇත්තේ කෙසේ ද? වඩාත්ම දියුනු ධනේශ්වර රට වන එක්සත් ජනපදයේ සමාජවාදය අත්කරගෙන තිබෙන්නේ ඉතා සුලු ප්‍රගතියක් බව පෙනී යයි. එහෙත්, ධනවාදය අඩුවෙන්ම වර්ධනයවී තිබෙන රටවල් අතරින් රුසියාව තුල, සමාජවාදය පිම් වලින් ඉදිරියට යමින් තිබේ. පරස්වාචකය පැහැදිලි කල යුත්තේ කෙසේ ද? තවත් ප්‍රශ්නයක් ද මතුව ආවේය. මාක්ස් ඇඟවුම්කල පරිදි, දියුනු රටවල්, අඩු දියුනු රටවල් විසින් අනිවාර්යයෙන්ම ප්‍රතිනිර්මානය කරගත යුතු සංවර්ධනයේ "රටාව" පෙන්නුම් කල අතර, ලෝකයේ දියුනුම හා බලගතුම රටේ සංවර්ධනය පිලිබඳ "සමාජවාදී නොවන" ඇඟවුම් කවරක් වූයේ ද? සොම්බාට්, එක්සත් ජනපදය යුරෝපයට සිය අනාගතය පෙන්වාදී ඇතැයි තර්ක කරමින් අතිශයින්ම තත්වාරක්ෂක වූ නිගමනයන් ගෙනහැර දැක්වීය.

කවුට්ස්කි විරෝධතාවක් මතු කලේය. සොම්බාට්ගේ ප්‍රකාශය, "පිලිගත හැක්කේ කොන්දේසි තොගයක් සමඟ පමනි." ඔහු ලිවීය. ධනවාදයේ ගෝලීය වර්ධනයෙහි පදනම මත වැඩී ආ ආර්ථික, සමාජ හා දේශපාලන සම්බන්ධතාවන්ගේ සංකීර්න සමස්තයක් වෙතින් ඒක පාර්ශවික ආකාරයකින් ඇමරිකානු තත්වයන් වියුක්තකර ගැනීම සමාජ විද්‍යාඥයාගේ (සොම්බාට්ගේ) වැරැද්ද විය. මාක්ස්ට බෙහෙවින් හුරු පුරුදු සංවර්ධනයේ රටාව ගැන සඳහන් කිරීමට සොම්බාර්ට් අසමත් විය. එනම්, එංගලන්තය සරලවම අනෙක් රටවල් තුල ප්‍රතිනිර්මානය නොවීමයි. මාක්ස්ගේ අවධියේ එංගලන්තය, අතිශයින්ම සංවර්ධිත කර්මාන්තයට හිමිකම් කීවේය. එහෙත් කාර්මික ධනවාදයේ වර්ධනය, කම්කරු පන්ති ප්‍රතිරෝධයේ හා සංවිධානයේ විරුද්ධ ප්‍රවනතා ජනනය කලේය. එබැවින් එංගලන්තය, චාටිස්ට් ව්‍යාපාරයේ ද පසුව වෘත්තීය සමිති හා සමාජ ප්‍රතිසංස්කරනයේ නැඟීම අත්දුටුවේය. එහෙත්, ධනේශ්වර සංවර්ධනයේ අන්තර් ක්‍රියාකාරිත්වය හා කම්කරු පන්තියේ ප්‍රති ක්‍රියාකාරිත්වය පැවතීගෙන ගිය මෙම වර්ධනය, ජාත්‍යන්තර "රටාවක්" පිහිටුවාලූයේ නැත.

කවුට්ස්කිගේ පැහැදිලි කිරීම:

> ප්‍රාග්ධනය විසින් සමස්ත ආර්ථික ජීවිතයම පාලනය කරන, සමස්ත රටවල් මාලාවක්ම අද දිනයේ දක්නට ලැබෙයි. එහෙත් ඒ කිසිවක් ධනේශ්වර නිෂ්පාදන මාදිලීන්ගේ සියලුම අංශ එකම පරිමානයකට වර්ධනය කලේ නැත. විශේෂයෙන්ම, අන්ත දෙකක් ලෙස එකිනෙකට මුහුනලා පිහිටි රටවල් දෙකක් තිබේ. මෙම නිෂ්පාදන මාදිලියේ මූලාශ්‍රයන් දෙකින් එකක් අසමානුපාතිකව ශක්තිමත්ව ඇත. එනම්, එහි සංවර්ධනයේ මට්ටමට අනුකූල විය යුතුවාට වඩා ශක්තිමත් යනුවෙනි: *ඇමරිකාවේදී ධනේශ්වර පන්තියත්, රුසියාවේදී කම්කරු පන්තියත්* වශයෙනි. (47)

එසේනම් ජර්මනියට සිය අනාගතය පෙන්වන්නේ කුමන රට ද? කවුට්ස්කි මෙසේ පිලිතුරු දුන්නේය.

> ජර්මනියේ *ආර්ථිකය* ඇමරිකානු ආර්ථිකයට සමීපස්ථය. අනෙක් අතට එහි *දේශපාලනය සමීප වන්නේ, රුසියානු* දේශපාලනයට ය. මේ ආකාරයට දෙරටම අපට අපගේ අනාගතය පෙන්වයි. එය අඩක් ඇමරිකානු හා අඩක් රුසියානු ස්වභාවයක් ගනු ඇත. රුසියාව හා ඇමරිකාව තව තවත් අධ්‍යයනය කරනතාක් දුරට අප, දෙරටම වටහා ගැනීම වඩාත් මැනෙවින් කරනතාක් දුරට අපට අපේ අනාගතය වඩාත් පැහැදිලිව තේරුම්ගත හැකිවනු ඇත. ඇමරිකානු නිදසුන පමනක් ගැනීම, රුසියානු නිදසුන පමනක් ගැනීම මෙන්ම නොමඟ යවන සුලුය. අපගේ අනාගතය පෙන්විය යුත්තේ හරියටම, රුසියානු කම්කරු පන්තිය විසින් ය යන්න අපූර්ව සංසිද්ධියක් වන බව සැබෑය. - මන්ද යත් ප්‍රාග්ධනයේ සංවිධානය නොව, කම්කරු පන්තියේ කැරලිකාරිත්වය තීරනාත්මකය යන්න ඉන් ඇඟවෙන බැවින්ය - මක්නිසා ද යත්, ධනේශ්වරයේ සියලු මහා රාජ්‍යයන් අතරින් රුසියාව, වඩාත්ම පසුගාමී රට වන බැවින් ආර්ථික සංවර්ධනය දේශපාලනයේ පදනම සකස් කරන්නේය යන ඉතිහාසයේ භෞතිකවාදී සංකල්පය මේ මඟින් ප්‍රශ්නයට භාජනය කරන බවක් පෙනී යන බැවින්ය. එහෙත් නිසැකවම මෙහිලා ප්‍රශ්නයට බඳුන් කෙරෙන්නේ, *සම්පරීක්ෂනයේ විධික්‍රමයක්* මත නොව, දැනටමත් *සකසා ඇති ආකෘතියක්* පිලිගැනීමේ හේතුව මත, අපගේ විරුද්ධවාදීන් හා විවේචකයන් අපට දොෂාරෝපනය කරන එක්තරා වර්ගයක ඓතිහාසික භෞතිකවාදයක

ප්‍රතිවිරෝධයන් පමනි. එවැන්නන් ඉතිහාසයේ භෞතිකවාදී සංකල්පය ප්‍රතික්ෂේප කරන්නේ, ඔවුන්ට එය වටහා ගැනීමට නොහැකිවීම නිසා හා එය පලදායී ලෙස භාවිතයට ගැනීමට නොහැකි කම නිසා පමනි. (48)

ඇමරිකාවේ දේශපාලන වර්ධනයෙහි සුවිශේෂත්වය පිලිබඳ කවුට්ස්කිගේ කරුනු දැක්වීම පිලිබඳ විභාගයක්, මෙම විමර්ෂනයේ විස්තරයට සැලකිය යුතු එකතු කිරීමක් නොකර කල නොහැකිය. යුරෝපයේ සිදුවූ ආකාරයට වඩා ඇමරිකාවේදී, සමාජවාදයේ වර්ධනය සුවිශේෂී ලෙස දුෂ්කර කලාවූ ආර්ථික හා සමාජ වාතාවරනය පිලිබඳව කවුට්ස්කි, උසස් අභිනිවේෂනාත්මක විශ්ලේෂනයක් ඉදිරිපත් කල බව පැවසීම අතිශයෝක්තියක් නොවේ. ඔහු පෙන්වා දෙන සාධක අතර, කම්කරු පන්තියේ දේශපාලන හා සමාජ ආසක්තයන් නොතකා හැරීමේදී බුද්ධිමතුන්ගේ සැලකිය යුතු කොටසක් දූෂනය කිරීමට, ඇමරිකානු ධනවාදයේ ඉමහත් වස්තු සම්භාරය ඉවහල්වූ ආකාරය පිලිබඳ විස්තරය ද වෙයි. කෙසේ වෙතත් කවුට්ස්කි සිය විග්‍රහය නිමා කරන්නේ, බොහෝ බාධක මධ්‍යයේ වුවත් අවසානයේදී එක්සත් ජනපදය තුල සමාජවාදය අසාමාන්‍ය වර්ධනයක් අත්කරගනු ඇති බව පෙන්වා දෙමිනි.

කවුට්ස්කිගේ "ඇමරිකානු කම්කරුවා" තමා තුල ඉමහත් බලපෑමක් ඇති කල බව ට්‍රොට්ස්කි සිය *ප්‍රතිපල හා ඉදිරිදර්ශනයෝ* යන කෘතිය තුල පැහැදිලි ලෙසම පිලිගත්තේය. ඉහතින් සඳහන් කල පරිච්ඡේද වල ඡේද ඔහු සිය කෘතිය තුල උපුටා දැක්වීය. තමා හා තම පරම්පරාවේ අනෙකුත් අය කවුට්ස්කිට ඉමහත් ලෙස නයගැති බව ට්‍රොට්ස්කි කිසි විටෙකත් බැහැර නොකලේය. කවුට්ස්කිගේ පසුකාලීන පාවාදීම් වලට ට්‍රොට්ස්කි සමාව නොදුන් නමුත්, ඔහුගේ ජයග්‍රහන ප්‍රතික්ෂේප කිරීම කෙසේ වෙතත් ඒවා අවතක්සේරු කිරීමේ අවශ්‍යතාවක් පවා ට්‍රොට්ස්කිට තිබුනේ නැත. කවුට්ස්කි අභාවයට පත් 1938 කාලයේදී ට්‍රොට්ස්කි, ඔහු අනුස්මරනය කලේ මෙසේය. "අපගේ හිටපු ගුරුවරයා ලෙස කලෙකදී අප බෙහෙවින් නයගැතිවූ පුද්ගලයා, පසුව කම්කරු පන්ති විප්ලවයෙන් තෙමේම වෙන්ව ගිය අතර එහි ප්‍රතිපලය ලෙස අපට ඔහුගෙන් වෙන්වීමට සිදු විය." (49)

නොනවතින විප්ලවයේ න්‍යාය විස්තාරනය කිරීමේදී ට්‍රොට්ස්කි වෙත කවුට්ස්කිගේ වැදගත් ප්‍රතිපදානය අවධාරනය කිරීම අවශ්‍යය. මක්නිසා ද යත්, නගා සිටුවීම සඳහා කවුට්ස්කි විසින් ප්‍රධාන භූමිකාවක් ඉටුකරනු ලැබූ සමාජවාදයේ න්‍යායික උරුමය, මුලුමනින්ම අපකීර්තියට ලක් කිරීමට උත්සාහ කරන්නේ යයි කියමින් සුලු ධනේශ්වරයේ ප්‍රති මාක්ස්වාදී වම්මුන් මේ වෙනුවෙන් තීන්ත හා කඩදාසි බොහෝ ප්‍රමානයක් නාස්ති කර ඇති බැවින්ය. ෆ්‍රැන්ක්ෆර්ට් ගුරු කුලය විසින් ඔසවා තැබූ හා විවිධ වර්ගවල සුලු ධනපති රැඩිකල්වාදය විසින් දකුනෙන් පෝෂනය කරන ලද, කවුට්ස්කිගේ වැඩකටයුතුවල සමස්ත ස්කන්ධයම හෙලාදැකීම එල්ල කරනු ලැබුවේ, 1914ට පූර්වයෙන් පැවති සමාජ ප්‍රජාතන්ත්‍රවාදයේ දුබලතාවල ස්වභාවය හා වෛෂයික මූලයන් පැහැදිලිකර ගැනීම අරමුනුකොට නොව, කම්කරු පන්තිය දේශපාලනිකව හා සංස්කෘතික වශයෙන් උගන්වාගැනීමේදී එය පදනම්වූ එහි දැවැන්ත ශක්තියට එරෙහිවය. 1914ට පූර්වයෙන් පැවති සමාජ ප්‍රජාතන්ත්‍රවාදය මත එල්ලවූ දේශපාලන පීඩනයන්ට දන ගසමින් ඒවායේ ගොදුරක් වීමට පෙරාතුව කවුට්ස්කිගේ ලිපි ලේඛන අධ්‍යයනය කිරීමෙන්, ලෙනින් හා ට්‍රොට්ස්කි ද ඇතුලු මාක්ස්වාදී චින්තනයේ වර්ධනය ගැඹුරින් වටහා ගැනීමේ හැකියාව ඇතිවේ. මෙම අනර්ග වෙලුමට සිය හඳුන්වාදීම නිමා කල ඩේ හා ගයිඩෝගේ වචන මෙම විශ්ලේෂකයා මුලුමනින්ම අනුමත කරයි:

> නොනවතින විප්ලවයේ න්‍යාය, ට්‍රොට්ස්කිගේ අනුගාමිකයන් හා ඔහුගේ විවේචකයන් අතර පමනක් නොව, ශාස්ත්‍රාලික ඉතිහාසඥයන් අතර ද දශක ගනනාවක් තිස්සේ අවධානය දිනාගෙන තිබේ. එහෙත්, කවුට්ස්කි විනිශ්චය කිරීමේදී ට්‍රොට්ස්කි මනාව වටහාගෙන තිබුනු පරිදි, ඉතිහාසයේ අධිකරනය හමුවේ ඉදිරිපත් වන්නන්ට තමන් සඳහා කථා කිරීමට සෑම අවස්ථාවක්ම සහතික කරනු වස් සාධාරනත්වය හා හැදියාව අවශ්‍ය වෙයි. (50)

1903 හා 1907 අතර වසරවල මාක්ස්වාදී සමාජ හා දේශපාලන චින්තනය, අසාමාන්‍ය වර්ධනයක් තුලින් ගමන් කොට තිබේ. මෙම ලියවිලි අධ්‍යයනය කිරීම වනාහි, දේශපාලන චින්තනය අදට වඩා සාපේක්ෂව ඉහලින් පැවති අවධියක් කරා යලි පිවිසීමකි. එහි දිගු භාවය තිබියදීම මෙම විමර්ෂනය, *නොනවතින විප්ලවයේ සාක්ෂිකරුවෝ* තුල අන්තර්ගත පොහොසත් දේ පිලිබඳ ඡායාමාත්‍රයක් පමනක් සම්පාදනය කර තිබේ. විවිධ අර්ථ කථනයන්ට විවෘතව තිබෙන, මෙම සංග්‍රහය තුල ඉදිරිපත්කොට ඇති දේ මෙන්ම, ලිපි ලේඛන සංකීර්න හා විවිධාකාර වීම නොවැලැක්විය හැකිය. රිචඩ් ඩේ හා ඩැනියෙල් ගයිඩෝගේ විනිශ්චයන් සමග මා නොඑකඟවන නිශ්චිත ක්ෂේත්‍ර මම ඇඟවුම්කර ඇත්තෙමි. එහෙත්, විසිවන සියවසේ විප්ලවවාදී න්‍යායේ වර්ධනය කෙරෙහි උනන්දුව යලි දල්වාලන, බොහෝ සමාජවාදීන්ට ද දැනෙනු ඇති, ඔවුන්ගේ වැදගත් ප්‍රතිපදානය පිලිබඳ මාගේ ඉමහත් අගය කිරීම මේ නිසා බිඳකුදු හීනවී නොයයි.

**අධෝලිපි**

(1) *The New Course,* නව මාවත (ලංඩන්: නිව් පාක්, 1972) 45 පිටුව.

(2) රිචඩ් බී ඩේ හා ඩැනියෙල් ගයිඩෝ විසින් පරිවර්තනය කර සංස්කරනය කල *Witnesses to*

*Permanent Revolution: The Documentary Record* නොනවතින විප්ලවයේ සාක්ෂිකරවෝ: ලේඛනගත වාර්තාව (බ්‍රිල්, 2009) 3 පි.

(3) එම, 9-10 පි.

(4) *Marx Engels Collected Works* මාක්ස් එංගල්ස් එකතුකල කෘති, 10 වෙලුම (ලංඩන්, ලෝරන්ස් හා විෂාට්, 1978) 280 පි.

(5) එම, 287 පි.

(6) Day and Gaido ඩේ හා ගයිඩෝ: 63 පි.

(7) එම, 181 පි.

(8) එම, 569 පි.

(9) එම.

(10) එම, 223 පි.

(11) එම, 541 පි.

(12) එම, 642-43 පි.

(13) එම, 36 පි.

14) එම, 376 පි.

(15) එම, 407 පි.

(16) එම, 374 පි.

(17) එම, 375 පි.

(18) එම, 70 පි.

(19) එම.

(20) එම, 133-34 පි.

(21) එම, 121-22 පි.

(22) Lenin, *Collected Works*, Vol. 5, ලෙනින් එකතුකල කෘති 5 වෙලුම (මොස්කව්, විදේශ භාෂා ප්‍රකාශන ආයතනය, 1961) 384 පි

(23) Day and Gaido, ඩේ හා ගයිඩෝ, 70 පි.

(24) එම, 473 පි.

(25) "Three Conceptions of the Russian Revolution, in *Writings of Leon Trotsky 1939–40* "රුසියානු විප්ලවයේ සංකල්ප තුන" ට්‍රොට්ස්කිගේ ලිපි 1939-40 (නිව් යෝර්ක් පාත් ෆයින්ඩර් 1973) 67 පි.

(26) ලෙනින්, එකතුකල කෘති, 9 වෙලුම (මොස්කව් ප්‍රගති ප්‍රකාශකයෝ, 1972) 56-57 පි.

(27) "Three Conceptions," "සංකල්ප තුන" 68 පි.

(28) Day and Gaido, ඩේ හා ගයිඩෝ: 257 පි.

(29) එකතුකල කෘති 9 වෙලුම 48 පි

(30) Day and Gaido, ඩේ හා ගයිඩෝ: 252 පි.

(31) එම, 261 පි.

(32) එම.

(33) එම, 267 පි.

(34) එම, 267-68 පි.

(35) එම, 282-84 පි.

(36) එම, 247 පි.

(37) එම, 236 පි.

(38) එම, 334 පි.

(39) එම, 347 පි.

(40) එම, 411 පි.

(41) එම, 416 පි.

(42) එම, 444-45 පි.

(43) එම, 493 පි.

(44) එම, අවධාරනය ඇඳිනි.

(45) එම, 502 පි.

(46) එම.

(47) එම, 620-21 පි.

(48) එම, 621 පි.

(49) එම, 58 පි.

(50) එම.

© www.wsws.org